# මාසික මහා සභා රැස්වීම

# 2023.01.10

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

**<u>මාසික මහ සභා රැස්වීම් වාර්තාව</u>**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2023.01.10
වේලාව :- පෙ.ව. 10.00

**<u>සහභාගිත්වය</u>**

ගරු සභාපති ,

1. ඊ.එම්.ඒ.එන්.බී. හඳගම මැතිතුමා

ගරු උප සභාපති ,

2. එස්.එම්.නිමල් ජයවර්ධන මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී / මන්ත්‍රිනී,

1. එච්.ආර්.අනුලාවති මැණිකේ මැතිතුමිය
2. කේ.එම්.ඩී.එම් බණ්ඩාර කුලසේකර මැතිතුමා
3. අයි.පී.එස්.පි.කේ.රණවීර මැතිතුමා
4. ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා
5. ඒ.ඒ.එන් ප්‍රසන්න මැතිතුමා
6. අයි. සිරිසේන මැතිතුමා
7. අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමා
8. ජේ.ඩී පද්මතිලක මැතිතුමා
9. ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා
10. එල්.එල්. නලින් බුද්ධික ජයසූරිය මැතිතුමා
11. ආර්.එස්.එස් ගුණතිලක මැතිතුමා
12. එච්. එම්. තිලකරත්න මැතිතුමා
13. එස්.ඒ.එස්.පී ධර්මසේන මැතිතුමා
14. එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමා
15. පී.ජී.එන්.පී රාජපක්ෂ මැතිතුමා
16. පී.ජී. රසික සුමේද ආරියරත්න මැතිතුමා
17. ජේ.එම්.ඒ.එස් ජයසිංහ මැතිතුමිය
18. එස්.පී.ආර්.ඒ පියරත්න මැතිතුමා
19. කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා
20. ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා
21. එස්.එම්.ආර්.ටී.බණ්ඩාර මැතිතුමා
22. ආර්.බී.පී වීරසිංහ මැතිතුමා
23. ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා
24. එච්.ජී.එල් සරත් කුමාර මැතිතුමා
25. පී.ඒ.පී තිලකරත්න මැතිතුමිය
26. එන්.එම්.ජී නවරත්න බංඩාර මැතිතුමා
27. ආර්.එම්. එස්. රණසිංහ මැතිතුමා
28. අර්.එම්.එස්.එස්.බණ්ඩාර රත්නායක මැතිතුමා
29. එච්.ආර්. ජී. එච්. බී. ජයසේකර මැතිතුමා
30. ආර්.එම්.ආර්.කේ රත්නායක මැතිතුමිය
31. එම්.එෆ්. අස්මියා මැතිතුමිය
32. කේ.ජී. උපාලි කුමාර අබේරත්න මැතිතුමා
33. කේ.ඒ.සී අමන්දා මැතිතුමිය
34. පී.ජී මල්ලිකා මැතිතුමිය
35. එච්.ආර්.ආර් මැණිකේ මැතිතුමිය

**<u>නිලධාරී සහභාගිත්වය</u>**

- ආර්.එම්.පී රත්නායක මිය - ලේකම්

**<u>ආගම සිහිකිරීම</u>**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව, පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිට මිය ගිය අය,රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## අ). 2022.12.13 මහ සභා වාර්තාව සම්මත කිරීම.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

2022.12.13 දිනැති මහ සභා වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසද, නොඑසේ නම් 2022.12.13 දිනැති මහ සභා වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙසද ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## සංශෝධන

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඩබ්.ඩී. ශ්‍රීලාල් මැතිතුමා**

2022.12.13 මහ සභා වාර්තාවේ 24 වන පිටුවේ දෙවන ඡේදයේ ''.............ළමුන් පළිහක් ලෙස යොදාගැනිම මෙහෙකාර සේවයේ යෙදවීම......''යන්න ''අරගල හා උද්ඝෝෂණවලදී ළමුන් පළිහක් ලෙස යොදාගැනිම වැලැක්වීම සඳහා'' ලෙස නිවැරදි විය යුතු බවත් ''.......... අයිස් නැමති මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ දරුවෙක් ඒ සඳහා මුදල් ඉල්ලා ඇති අවස්ථාවක මුදල් ලබා නොදීම හේතුවෙන් මහල් නිවාසයෙන් පැන සියදිවි නසාගැනිම........'' යන්න ''අයිස් නැමති මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයෙක් මුදල් නොදීම නිසා මහල් නිවාසයෙන් පහළට දමා දරුවා මරණයට පත් කල බව....'' ලෙස නිවැරදි විය යුතු බව ශ්‍රීලාල් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ආර්.කේ රත්නායක මැතිතුමිය**

2022.12.13 දිනැති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ආර්.කේ රත්නායක මැතිතුමිය විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව 2022.12.13 දිනැති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

2022.12.13 දිනැති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

## ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන

## ඇ). සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාගත කිරීම.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

1. සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AC/1/7/2022/3 හා 2023.01.03 දින ලිපිය මගින් දන්වා ඇත්තේ පළාත් පාලන සභිකවරුන්ගේ මාසික දීමනාව ගෙවීම සම්බන්ධව ගැටළුකාරී තත්වයක් පවතින බැවින් ඉදිරි මාසික දීමනාව ගෙවීමේදී මසක කාලයක් ආවරණය නොවන අවස්ථාවක අදාළ දින ගණනට අනුපාතිකව ගණනය කර දීමනාව ලබාදිය යුතු බව දන්වා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

2. [illegible]

3. රඹුක්කන, කිරිවන්දෙණිය, වැලිකන්ද පාර, එ/41 පදිංචි කේ.ආර්.උපුල් උදය කුමාර මහතා ලිපියක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ 2022.12.09 වන දින RPS 01/15/01/46/39671-1 අංකය යටතේ දැනුම් දෙන පරිදි නිවසට ආසන්නව ඇති ඉඩමේ අනතුරුදායක ගස් ඉවත් කිරිමට දැනුම්දී දැනට දින 14 ගත වුවද කවමත් ගස් ඉවත් කර නොමැති බව දන්වා එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

අද දින ඉදිරිපත් කිරිමට කල් දී ඇති ප්‍රශ්න නොමැති බව ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉ). යථා පරිදි කල්දී ඇති යෝජනා

i. 2023 වර්ෂය සඳහා රඹුක්කන මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව,නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව,කාර්මික සේවා කාරක සභාව,පරිසර හා පහසුකම් සැකසීමේ කාරක සභාව සඳහා පහත සඳහන්වන පරිදි සභාපතිවරු හා සාමාජිකයන් පත්කිරිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | අතුල හඳගම මැතිතුමා | සභාපති |
| 2. | ගරු උප සභාපති | එස්.එම්.නිමල් ජයවර්ධන මැතිතුමා | සාමාජික |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.රසික සුමේධ ආරියරත්න මැතිතුමා | සාමාජික |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජේ.ඩී.පද්මතිලක ජයසිංහ මැතිතුමා | සාමාජික |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.ජී.එස්.කේ.කේ.සුමනසේකර මැතිතුමා | සාමාජික |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | අයි.සිරිසේන මැතිතුමා | සාමාජික |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.ජී.සමීර පුෂ්පකුමාර ධර්මසේන මැතිතුමා | සාමාජික |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා | සාමාජික |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.එම්.රංජිත් වීකිරි බණ්ඩාර මැතිතුමා | සාමාජික |

❖ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව

| | | | |
|---|---|---|---|
| 1. | ගරු උප සභාපති | එස්.එම්.නිමල් ජයවර්ධන මැතිතුමා | සභාපති |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.ආර්.අනුලාවතී මැණිකේ මැතිතුමිය | සාමාජිකා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.පී.සුරංග සම්පත් ගුණතිලක මැතිතුමා | සාමාජික |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.එච්.තිලකරත්න බංඩා මැතිතුමා | සාමාජික |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.ඒ.එන්. ප්‍රසන්න මැතිතුමා | සාමාජික |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.ජී.එල් සරත් කුමාර මැතිතුමා | සාමාජික |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.මල්ලිකා මැතිතුමිය | සාමාජිකා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා | සාමාජික |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එන්.එම්.ජී.එන් බංඩාර මැතිතුමා | සාමාජික |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.එම්.එස්.එස්.බී. රත්නායක මැතිතුමා | සාමාජික |

❖ කාර්මික සේවා කාරක සභාව

| | | | |
|---|---|---|---|
| 1. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | අයි.ජී.සුමිත් පද්ම කුමාර රණවීර මැතිතුමා | සභාපති |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.නිශාන්ත ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා | සාමාජික |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | අයි.උපාලි පුෂ්පකුමාර බාලසූරිය මැතිතුමා | සාමාජික |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.ඒ.සමීර පුෂ්පකුමාර ධර්මසේන මැතිතුමා | සාමාජික |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.එම්.තිලකරත්න මැතිතුමා | සාමාජික |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එල්.ඩබ්.එල්.නලින් බුද්ධික ජයසූරිය මැතිතුමා | සාමාජික |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.කේ.ඩී.වික්‍රමසිරි මැතිතුමා | සාමාජික |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.ආර්.ජී.එච්.බණ්ඩාර ජයසේකර මැතිතුමා | සාමාජික |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | එච්.ආර්.රත්නවතී මැණිකේ මැතිතුමිය | සාමාජිකා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ආර්.එම්.රත්නා කුමාරි රත්නායක මැතිතුමිය | සාමාජිකා |

❖ පරිසර හා පහසුකම් සැකසීමේ කාරක සභාව

| | | | |
|---|---|---|---|
| 1. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.එම්.ඩී.එන්.බණ්ඩාර කුලසේකර මැතිතුමා | සභාපති |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ජේ.එච්.අමන්දි සුලක්ෂිනි ජයසිංහ මැතිතුමිය | සාමාජිකා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ඩබ්.ජී.සුමිත් රත්නකුමාර මැතිතුමා | සාමාජික |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.බංඳු ප්‍රියංකර වීරසිංහ මැතිතුමා | සාමාජික |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ටී.ඩබ්.දිල්රුක් ශ්‍රී ලාල් මැතිතුමා | සාමාජික |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ජී.ඒ.පද්මාවතී තිලකරත්න මැතිතුමිය | සාමාජිකා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | කේ.ඒ. චලනි අමන්දා මැතිතුමිය | සාමාජිකා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.ජී.උපාලි කුමාර අබේරත්න මැතිතුමා | සාමාජික |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | මොහොමඩ් මුසම්මිල් පවුසල් අස්මියා මැතිතුමිය | සාමාජිකා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.එම්. සමන්ත රණසිංහ මැතිතුමා | සාමාජික |

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2023 වසර සඳහා වූ කමිටු මණ්ඩල පත් කිරීමේ යෝජනාව සම්මත කිරීමට තීරණය විය.

ii. සභාව සතු කඩ කාමරවල මාසික බදු කුලී ප්‍රතිශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කඩකුලී තක්සේරු වාර්තා ලබාගෙන ඇති අතර ඒ අනුව කඩකුලී ප්‍රතිශෝධනය කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

තක්සේරු දෙපාර්තමේන්තුවේ කඩකුලී තක්සේරු වාර්තාවලට අනුව කඩකුලී ප්‍රතිශෝධනය කිරීමට සිදුවන බවත් එම වාර්තා පිළිගෙන මේ වසරේ මැයි මාසයේ සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දෙවන කාර්තුවේ මැයි සිට කඩකුලී ප්‍රතිශෝධනය කිරීමට තීරණය විය.

iii. අංක 30/30 පිංදෙණිය වත්ත,නගර සභා නිවාස අසල,රඹුක්කන ලිපිනයේ පදිංචි පි. මල්ලිකා රාණි මිය විසින් තම නිවස අසල සභාවට අයත් පර්චස් එක හමාරක පමණ බිම් කොටස බදු වශයෙන් ලබාදෙන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇත. ආදායම් පරීක්ෂක විසින් එම ඉඩමේ තැඹිලි ගස් දෙකක් පවතින බවත් වාර්ෂිකව රු.1000.00ක මුදලකට බදු ලබාදීම සුදුසු බවටත් වාර්තා කර ඇති අතර ගරු සභාපතිතුමන් විසින්ද වාර්ෂිකව රු.1000.00ක මුදලකට බදු ලබාදීම සුදුසු බවට යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

වාර්ෂිකව රු.1000.00ක මුදලකට බදු ලබාදීමට තීරණය විය.

iv. රඹුක්කන රෝහල් භූමියේ අක්කරයක පමණ බිම් කොටසක් සුද්ද කර පොල් වලවල් කැපීම සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙසට එම රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිතුමන් විසින් ඉල්ලීමක් සිදු කර ඇති අතර ඒ සඳහා බැකෝ යන්ත්‍රය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.දිල්රුක් ශ්‍රී ලාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

JCB යන්ත්‍රය පෞද්ගලිකව ලබාදීමේ හැකියාව පවතිනවාද ගරු මන්ත්‍රීතුමන් විසින් විමසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

JCB යන්ත්‍රය රියදුරු වෙනස් කළ බැවින් එය පෞද්ගලිකව ලබාදිය හැකි බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.දිල්රුක් ශ්‍රී ලාල් මැතිතුමා

රඹුක්කන රෝහලේ අධ්‍යක්ෂකතුමා ඇතුළු කාර්යය මණ්ඩලය විසින් කරනු ලබන සංවර්ධන කටයුතු වෙනුවෙන් සහය දැක්වීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

JCB යන්ත්‍රය දින දෙකක් සඳහා ලබාදීමට තීරණය විය.

v. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසට උපදෙස් ලබාදී ඇති අතර ඒ අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් යන දරුවන් වෙනුවෙන් පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමට සභා අරමුදලින් රු.2,500,000.00 ක මුදලක් වෙන් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් යන දරුවන් වෙනුවෙන් පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමට සභා අරමුදලින් රු.2,500,000.00 ක මුදලක් වෙන් කිරීම සඳහා තීරණය කළ බවත් එක් දරුවෙකු සඳහා රු.1000.00 බැගින් ළමුන් 2500 ක් සඳහා පොත්පත් ලබාදීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. මේ සම්බන්ධයෙන් වන ඉල්ලුම් පත්‍රය පළාත් සභාව විසින් ලබාදී ඇති අතර එම ඉල්ලුම්පත් ළමුන් විසින් පුරවා වසමේ ග්‍රාම නිලධාරිවරයා මෙන්ම පාසලේ විදුහල්පතිතුමා විසින්ද අනුමත කරගත යුතු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

මෙම පාසල් උපකරණ ලබාදීමේදි සුදුස්සන් තෝරාගනු ලබන්නේ කුමන පදනමක් යටතේද? මෙම ඉල්ලුම්පත්‍රය ජනතාවට ලබාදෙන්නේ කුමන ආකාරයෙන්ද යන්න ගරු මන්ත්‍රීතුමන් විසින් විමසන ලදි.එමෙන්ම මෙවැනි වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධව ග්‍රාම නිලධාරින් හරහා ක්‍රියාත්මකවන ආකාරය දක්නට ලැබෙන අතර මෙම වැඩසටහන දේශපාලනයෙන් තොරව අප ආයතනය හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

මෙම වැඩසටහන සම්බන්ධ උපදෙස් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලබාදුන් අතර එම චක්‍රලේඛයේ ඒ සඳහාවන ඉල්ලුම්පත්‍රයද ඇතුළත් කර ඇති බවත් ග්‍රාම නිලධාරි සහ විදුහල්පති අතින් සහතික කළ යුතු අතර මෙම ඉල්ලුම්පත්‍ර මන්ත්‍රීවරුන් හරහා බෙදාදීමට කටයුතු කරන බවත් දන්වන ලදි.විශේෂයෙන්ම එක් පවුලක් සඳහා එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් ලබාදීමට කටයුතු කරන ලෙසත් එක් කොට්ඨාසයකට මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් සිටින බැවින් සියලුම කොට්ඨාසවලට සමානව බෙදී යන පරිදි ලබාදිය යුතු බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

ඒ වගේම පොත් මිලදිගැනිම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කරවා මිල ගණන් කැඳවීමට අධික වියදමක් දැරිය යුතු බැවින් 2023 වර්ෂය සඳහා සභාවේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන් වෙතින් පමණක් මිල ගණන් කැඳවීමක් සිදු කළ යුතු බවත්, ඒවා මහ සභාවට ඉදිරිපත් කර අනුමත කළ පසු අදාල ආයතනයෙන් පොත් මිලදී ගෙන පාර්සල් කර මන්ත්‍රීවරුන් හට ලබාදෙන අතර ඒවා බෙදාදීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර මන්ත්‍රීවරුන් හරහා බෙදාදීමේ කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. මෙම කටයුත්ත සභා අරමුදලින් සිදු කරන අතර මෙම ඉල්ලුම්පත් බෙදාදීමේ කටයුතුද මන්ත්‍රීවරුන් හරහා සිදු කිරීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

මේ අයුරින් පොත් කොපමණ ප්‍රමාණයක් ලබාදිය හැකිද? ඒ වගේම කොපමණ පවුල් ප්‍රමාණයක් සඳහා ලබාදිය හැකිද? යන්න ගරු මන්ත්‍රීතුමන් විසින් විමසන ලදි. එමෙන්ම මෙම යෝජනාව ප්‍රමාද නොකර ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පවුල් 2500 ක් සඳහා මෙම පොත් ලබාදීමට තීරණය කර ඇති බවත් මිල ගණන් කැඳවීම සිදු කළ යුතු අතර එක් දරුවෙකු සඳහා පොත් කීයක් ලබාදෙන්නේද යන්න නිවැරදිව ප්‍රකාශ කළ නොහැකි බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රමාද නොකල බවත් චක්‍රලේඛය ලැබුණ පසු ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කළ බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන

ලදි.රටේ පවතින ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගෙන ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුකාරතුමාට ලබාදුන් උපදෙස් මත දිළිඳු දරුවන් සඳහා පොත් ලබාදීමට යොමු වූ පළමු අවස්ථාව මෙය වන බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. මෙම කාර්යය සඳහා වැය ශීර්ෂයක් නොමැති බවත් පොදු අරමුදල්වලින් මුදල් වෙන් කළ බවත් අයවැය සම්මත කරන අවස්ථාව වන විටවත් මෙම චක්‍රලේඛය ලැබී තිබුණා නම් අධ්‍යාපන ආධාර වශයෙන් මුදල් වෙන් කිරීමට හැකියාව තිබුණ බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

අපි සභාවක් ලෙස ගනු ලබන තීරණ ක්‍රියාත්මක නොවන අතර මාස කිහිපයකට පෙර දිළිඳු පවුල් සඳහා වියළි ආහාර මල්ලක් ලබාදීමට යෝජනා කරනු ලැබුවත් එම යෝජනා ක්‍රියාත්මක වන බවක් දක්නට නොලැබෙන අතර ආණ්ඩුකාරතුමාගේ මෙන්ම නිලධාරීන්ගේ වැරදි නිසා ක්‍රියාත්මක නොවන බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.මෙම යෝජනාවට අනුව පොත් ලබාදීම නැවත අලුත් වර්ෂයක් ආරම්භයට පෙර ලබාදීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ඔබතුමා විසින් ගෙනා දිළිඳු පවුල් සඳහා වියළි ආහාර මල්ලක් ලබාදීමේ යෝජනාව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කර ඇති බව ගරු සභාපතිතුන් විසින් දන්වා සිටින ලදි.මෙම ඉල්ලුම්පත්‍ර මුද්‍රණය කිරීමෙන් පසු එම කටයුතු ආරම්භ කරන බවත් සියලුම පළාත් පාලන ආයතන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන නිසා පොත් මිලදීගැනීමේදී යම් ප්‍රමාදයක් දක්නට ලැබෙන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.දිල්රුක් ශ්‍රී ලාල් මැතිතුමා

මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව සතුටට පත්වන බවත් ඒ වගේම රඹුක්කන කොට්ඨාසය තුළ සමෘද්ධි ප්‍රතිලාභයවත් නැති අඩු ආදායම්ලාභී පවුල් දක්නට ලැබෙන බව ගරු මන්ත්‍රීතුමන් විසින් පැවසූ අතර පොත්වල මිල ගණන් වැඩි වී ඇති නිසා එක් දරුවෙක් සඳහා ලබාදෙන රු.1000.00 පොත් ප්‍රමාණයට වඩා රු.1500.00 දක්වා වැඩි කළ යුතු බවත් පිටු 120 පොත් ලබාදීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.මෙම වැඩසටහන ප්‍රමාද නොකර ක්‍රියාත්මක කිරීම සුදුසු බව එතුමන් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

කොපමණ ප්‍රමණයේ පිටු සහිත පොත් ලබාදෙන්නේද යන්න තීරණය කළ යුතු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සිරිසේන මැතිතුමා

මෙම ළමුන් සඳහා විවිධ වර්ගයේ පොත් අවශ්‍ය වන බැවින් ඒ සඳහා තෝරාගැනීමක් සිදු කළ යුතු බවත් ගරු සිරිසේන මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ඇත්තටම මෙම ඉල්ලුම්පත් ලබාගෙන වෙන් වෙන් වශයෙන් තෝරාගැනීම් කිරීම සඳහා කාලයක් නොමැති බවත් ඒ නිසා පිටු 120 පොත් ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමට සභා අරමුදලින් රු.2,500,000.00 ක මුදලක් වෙන් කිරීමට තීරණය වූ අතර එහිදි පිටු 120 පොත් ලබාදීමටද තීරණය විය.

vi. කෑ/මාව සුජාතා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා කරඟ සඳහා පහත දිනයන්හි ක්‍රීඩාපිටි ගෙවීමකින් තොරව ලබාදෙන ලෙසට එම විද්‍යාලයේ විදුහල්පති විසින් ඉල්ලීමක් සිදු කර ඇත.

1. බතඹුරය ක්‍රීඩා පිටිය - 2023.01.04,05,06,09,10,11,12,13,14,15,16,17,18,19,20
2. අශෝක ක්‍රීඩා පිටිය - 2023.01.04,05,06,10,18

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ගෙවීමකින් තොරව ක්‍රීඩාපිටි ලබාදීමට තීරණය විය.

vii. ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ (සම්පත් බැංකුව පිහිටි ස්ථානය) කඩ කාමරය රු.125,000.00ක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති අතර සී/ස කිණිගොඩ කෝරලේ සමුපකාර බැංකුව විසින් එහි ශාඛාවක් එම ස්ථානයේ ස්ථාපිත කිරීම සඳහා මාසික බදු කුලිය වශයෙන් රු.100,000.00 බදු පදනම මත ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ(සම්පත් බැංකුව පිහිටි ස්ථානය) කඩ කාමරය දැනට හිස්ව පවතින අතර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති මුදල රු.125,000.00 වන බවත් ගිවිසුම්ගත වීමෙන් වසර 3 (තුනකට) පසු එම මුදලෙන් 10% ක ප්‍රමාණයක් වැඩිවන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී. මෙම කඩ කාමරය බදු දීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කරනු ලැබුවත් ඒ සඳහා ප්‍රතිචාරයක් නොලැබුනු බවත් සී/ස කිණිගොඩ කෝරලේ සමුපකාර බැංකුව විසින් රු.100,000.00 ක මුදලකට ඉල්ලුම් කර ඇති බවත් කඩ කාමරය බදු ගැනීම සඳහා පැමිණි සමහර ආයතනවලින් මෙවැනි මුදලකට ඉල්ලීම් නොකල බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා

සී/ස කිණිගොඩ කෝරලේ සමුපකාර බැංකුව වෙත විශාල පිරිසක් සම්බන්ධ වී සිටින බැවින් නගරයට ආසන්න ස්ථානයකට එම බැංකුව රැගෙන එම වැදගත් බව ගරු මන්ත්‍රීතුමන් විසින් පැවසූ අතර මෙම කඩ කාමරය මිලදීගැනීම සඳහා ඉල්ලුම් කල සකොස ආයතනය විසින් මෙම මුදල් ප්‍රමාණය ඉදිරිපත් නොකල අතර කිණිගොඩ කෝරලේ සමුපකාර බැංකුව වෙත ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සී/ස කිණිගොඩ කෝරලේ සමුපකාර බැංකුව වෙත රු.100,000.00 ක මුදලකට කඩ කාමරය ලබාදීමට තීරණය විය.

viii. පහත සඳහන් සභා දේපල 2023/2024 වර්ෂය වෙනුවෙන් රක්ෂණය කිරීම සඳහා ගෙවීම් කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

1. විජයමාන්නා ආදාහනාගාරය - රු.24121.50
2. ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය - රු.9290.98

විජයමාන්නා ආදාහනාගාරය සහ ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය සඳහා වන රක්ෂණ මුදල් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.එන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රක්ෂණ මුදල් ගෙවීමට තීරණය විය.

ix. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් ස්ථානවල ගිනි නිවන උපකරණ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1. බණ්ඩාරනායක ප්‍රජා ශාලාව සහ වෙළඳ සංකීර්ණය - රු.28,100.00
2. රඹුක්කන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල - රු.19,900.00
3. ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය - රු.4200.00
4. රඹුක්කන ප්‍රාදේශීය සභා ආදාහනාගාරය - රු.15,000.00

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ගිනි නිවන උපකරණ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමට තීරණය විය.

x. GIS තාක්ෂණයෙන් මාර්ග සිතියම්ගත කිරීමේ විශේෂ වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර අයි.ජී.එස්.පී.කේ.රණවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1. ජනවාරි මාසය - රු.17,500.00
2. පෙබරවාරි මාසය - රු.17,500.00

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

සංග්‍රහ කටයුතු සඳහා කරන වියදම් මේවන විට නතර කර නොමැතිද? ගරු මන්ත්‍රීතුමන් විමසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

මේ දිනවල GIS තාක්ෂණයෙන් මාර්ග සිතියම්ගත කිරීමේ විශේෂ වැඩසටහන ක්‍රියාත්මක වන අතර පළාතේ තිබෙන සියලුම මාර්ග සිතියමට ඇතුළත් කරන බවද මෙම සිතියම මඟින් පළාතේ ඇති සියලුම මාර්ග බැලිය හැකි බවත් එයින් කොටසක් ඇතුළත් කර ඇති බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබාදීමට තීරණය විය.

xi. රඹුක්කන පොදු වැසිකිලිය 2023 වර්ෂයට ටෙන්ඩර් කිරීමේදී ලංසුකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් වූ අතර එහිදී වැඩිම ලංසුව ඉදිරිපත් කල අයි.එස්.ප්‍රේමලාල් මහතාට ලංසුව පිළිගත් බව හා ගිවිසුම් ඇප මුදල් 2022.12.19 දිනට පෙර ගෙවන ලෙසට දැනුවත් කෙරිණ.නමුත් ඔහු නියමිත දිනට මුදල් ගෙවීමට ඉදිරිපත් නොවූ අතර 2022.12.21 දිනැතිව අභියාචනයක් ඉදිරිපත් කර ඇත. 2022.12.27 දින එම අභියාචනය මුදල් කමිටුවට ඉදිරිපත් කල අතර එහිදී තීරණය වූයේ පළමු ටෙන්ඩර්කරු හට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට වුවත් තවත් ලංසුකරුවෙකු ඉදිරිපත්ව ඇති බැවින් මේ පිළිබඳව නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා මහ සභාව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.තිලකරත්න බංඩා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

රඹුක්කන පොදු වැසිකිලිය ටෙන්ඩර් කිරීමෙන් පසු ටෙන්ඩර්කරුවන් දෙදෙනෙකු ඉදිරිපත් වූ අතර ඒ අතරින් වැඩිම ලංසු මුදල ඉදිරිපත් කල ටෙන්ඩර්කරු හට ලබාදීමට තීරණය වූ බවත් එම ටෙන්ඩර්කරු දින 14 ඇතුළත මුදල් ගෙවා ගිවිසුම් අත්සන් කල යුතු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. නමුත් දින 14 ඇතුළත මුදල් ගෙවා ගිවිසුම් අත්සන් කර ටෙන්ඩරය ලබා නොගත් අතර ලිපියක් මඟින්ද ඉල්ලීමක් නොකල බවත් එම නිසා දෙවනි ටෙන්ඩර්කරු හට ටෙන්ඩරය ලබාදීමට තීරණයක් ගැනීම සඳහා මහ සභාවට ඉදිරිපත් කිරීමට තීරණය කළ බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

මෙම ටෙන්ඩර්කරුවන් කුමන ප්‍රදේශවලද සහ ඉදිරිපත් කළ ටෙන්ඩර් මිල ගණන්වල පරතරය කොපමණද යන්න ගරු මන්ත්‍රීතුමන් විසින් විමසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පළමු ටෙන්ඩර්කරු වරකාපොල බවත් දෙවන ටෙන්ඩර්කරු රඹුක්කන බවත් එහි ටෙන්ඩර් මිල ගණන්වල පරතරය රු.40450.00 පමණ වන බවත් ගරු සභාපතිතුමන් විසින් පැවසූ අතර පළමු ටෙන්ඩර්කරු ඉදිරිපත් නොවූ අවස්ථාවක නීත්‍යානුකූලව දෙවැනි ටෙන්ඩර්කරු හට ලබාදීමට හැකියාව පවතින බවද ප්‍රකාශ කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා

පළමු ටෙන්ඩර්කරු ලිපියක් මඟින් හෝ දැනුම්දීමක් කර නොතිබුණාද යන්න ගරු මැතිතුමන් විසින් විමසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පළමු ටෙන්ඩර්කරු දින නියමිත දිනය ඉක්මවීමෙන් පසු සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ අතර ලිපියකින් හෝ ඒ සම්බන්ධව දැනුම්දීමක් නොකල බවත් පළමු ටෙන්ඩර්කරු විසින් පින්නවල අලිගාල අසල සහ රඹුක්කන වැසිකිලි දෙක සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අතර පින්නවල අලිගාල අසල වැසිකිලිය සඳහා එක් ටෙන්ඩර්කරුවෙක් පමණක් ඉදිරිපත් වූ බැවින් එම වැසිකිලියේ ටෙන්ඩරය පළමු ටෙන්ඩර්කරුට හිමිවූ බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. මුදල් සහ ප්‍රතිපත්ති කමිටුවේදිද මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කල අතර එහිදී තීරණය කලේ පළමු ටෙන්ඩර්කරු හට ටෙන්ඩරය ලබාදීමට තීරණය වුවත් නීතිමය ගැටළුවක් බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට මහ සභාව වෙත ඉදිරිපත් කළ බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ඩී.එම් බණ්ඩාර කුලසේකර මැතිතුමා**

සභාපතිතුමනි පින්නවල අලි අනාථාගාරය අසල ඇති වැසිකිලිය භාවිතා කිරිමේදි එක් අයෙකුගෙන් රු.30.00 මුදලක් අය කරන අතර එහි අසල සිටින පිරිසට වැසිකිලිය නොමිලේ භාවිතා කිරිමට ලබා නොදෙන බවත් ඒ අසල තිබෙන වතුර බටය ඉවත් කරන බව පවසා ඇති බවත් ගරු බණ්ඩාර කුලසේකර මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

යම්කිසි සභා දේපලක් ටෙන්ඩර් කිරිමෙන් අනතුරුව මිලදි ගත් පසු එම ස්ථානවලින් යම් මුදලක් උපයාගන්නා බවත් නොමිලේ පහසුකම් සැපයීම සඳහා යොමු නොවන බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. එවැනි සිදුවීමක් රඹුක්කන බස් නැවතුම්පොල අසල වැසිකිලිය සම්බන්ධයෙන්ද ඇති වූ අතර රියදුරු කොන්දොස්තර මහත්වරුන් විසින්ද වැසිකිලිය නොමිලේ භාවිතා කිරිමට ඉල්ලා සිටියත් ටෙන්ඩර්කරුවන් කැමැත්තක් නොදක්වන බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දෙවන ටෙන්ඩර්කරු හට ටෙන්ඩරය ලබාදීමට තීරණය විය.

xii. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු පහත නම් සඳහන් නිලධාරි හා සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම අනුව සේවක ණය මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ රණවීර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

1. ඊ.එම්.එන්.ඒකනායක මයා - රු.100,000.00
2. ජී.ආර්.එන්.කේ.මැණිකේ මිය - රු.100,000.00
3. කේ.එම්.අයි.සි..ගීතාංජලි මිය - රු.100,000.00
4. ඒ.ධර්මදාස මයා - රු.100,000.00

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

සේවක ණය මුදල් ගෙවීමට තීරණය විය.

xiii. 2022.12.01 සිට 2022.12.27 දක්වා උපලේඛන අංක 01හි සඳහන් වියදම් දැරීම සුදුසු බව ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

| දිනය | වවු.අංක. | නම | විස්තරය | වටිනාකම(රු) |
|---|---|---|---|---|
| 2022.12.01 | 1900 | Kegalle Distributers (Pvt)Ltd | ආදාහනාගාරය වෙත 37.5Kg ලිට්රෝ ගෑස් සිලින්ඩර 05ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 89720.00 |
| | 1901 | ජාතික ජල සම්පාධන හා ජලාපවාහන මණ්ඩලය. | 2022 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වල ජල බිල්පත් ගෙවීම. | 76071.87 |
| | 1902 | බී.එන්.එන්.එස්.ජයකොඩි මිය. | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 1750.00 |
| | 1903 | එම්.සී.එම්.රත්නායක මයා. | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 3232.00 |
| | 1904 | බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරණායක මිය. | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ අයවැය විශේෂ මහා සභාව සඳහා සංග්‍රහ කටයුතු වලට අවශ්‍ය සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් විෂය නිළධාරී බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරණායක මිය විසින් පෞද්ගලිකව වැය කළ මුදල නැවත ගෙවීම. | 14715.00 |
| | 1905 | ජේ.එන්.එල්.ජයසිංහ මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 2722.00 |
| | 1906 | එච්.ඩබ්.ඒ.අයි.ලක්මාල් මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 3266.00 |
| | 1907 | ඩී.ඒ.එස්.ප්‍රේමසිරි මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 4174.00 |
| | 1908 | එස්.එන්.නන්දශ්‍රී මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 9074.00 |
| | 1909 | එම්.පී.ආර්.සී.කේ.ප්‍රනාන්දු මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 3452.00 |
| | 1910 | බී.එච්.ඒ.එච්.කුමාර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 9722.00 |
| | 1911 | ජේ.පී.ආර්.ඩී.ජයසුන්දර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 9722.00 |
| | 1912 | ඩී.ආර්.ආර්.එස්.කුමාර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 9722.00 |
| | 1913 | එම්.සී.එම්.රත්නායක මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 1836.00 |
| | 1914 | එම්.පී.පී.ආර්.ධර්මශ්‍රී මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 4362.00 |
| | 1915 | එස්.ඩබ්.පී.ධර්මසේන මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 5052.00 |
| | 1916 | ඩබ්.එන්.පී.කුමාර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 10277.00 |
| | 1917 | ජී.ජී.ජී.රත්නපාල මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 9629.00 |
| | 1918 | ඩී.පී.ජී.ආරියරත්න මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 3671.00 |
| | 1919 | බී.වී සිසිර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 3266.00 |
| | 1920 | ආර්.කේ.එච්.එම්.කේ.එස්.බංඩාර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 5395.00 |
| | 1921 | එච්.ඒ.එස්.ආර්.හේනකආරච්චි මිය. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 1049.66 |
| | 1922 | පී.එම්.ජේ.වීරසිංහ මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 6487.00 |
| | 1923 | කේ.ජී.එස්.එස්.බංඩාර මයා. | නිවාඩු දින වැටුප් - නොවැම්බර් මාසය. | 5396.00 |
| | 1924 | මුදල් භාරකරු | ආදාහනාගාර දිරි දීමනා -නොවැම්බර් මාසය | 10200.00 |
| | 1925 | ඩබ්.එජ්.වී.මධුශංක මයා. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 534.00 |
| | 1926 | කේ.ජී.එස්.එස්.බංඩාර මයා. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 700.00 |
| | 1927 | කේ.ජී.එස්.එස්.බංඩාර මයා. | ගමන් වියදම් - ඔක්තෝබර් මාසය. | 339.50 |
| | 1928 | කේ.ජී.එස්.එස්.බංඩාර මයා. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 700.00 |
| | 1929 | පී.ජී.ඩී.විජයන්ති මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 1752.00 |
| | 1930 | බී.ඒ.ඒ.එච්.කුමාර මයා. | ගමන් වියදම් - ඔක්තෝබර් මාසය. | 1358.00 |
| | 1931 | බී.ඒ.ඒ.එච්.කුමාර මයා. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 1400.00 |
| 2022.12.02 | 1932 | ඒ.ඩබ්.ජයරත්න මයා | සභාව සතු වාහන කිහිපයක වාර්ෂික අදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 18315.00 |
| | 1933 | ඒ.ඩබ්.ජයරත්න මයා | සභාව සතු ඇමුණුමෙහි සඳහන් වාහන වල වාර්ෂික ආධායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 17895.00 |
| 2022.12.05 | 1934 | RP Technology | ආයතන අංශයේ පොදු පරිගණකයකට යෙදීමට mouse 01ක් හා Keybord 01ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2300.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1935 | සුරමායා සෙරමික් | කාර්යාලය වෙත T.T.වයර් 6m ක් හා 13A ප්ලග් ටොප් 03ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2250.00 |
| | 1936 | ලේඛා ස්ටේෂනර්ස් | රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසැලේ නිර්මාණ ප්‍රදර්ශනයේ කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1600.00 |
| | 1937 | එම්.පී.පී.අයි.ධර්ම ශ්‍රී මයා | එම්.පී.පී.අයි.ධර්මශ්‍රී මයාගේ රාජ්‍ය සේවන අර්ථසාධක අරමුදල යටතේ හිඟ මුදල ගෙවීම. | 365728.32 |
| | 1938 | සභාපති,රඹුක්කන ප්‍රාදේශීය සභාව | රඹුක්කන බස් නැවතුම් පොළ අසල පොදු වැසිකිලිය බදු ලබාගෙන ඇති ඩබ්.ටී.විජේරත්න මහතාගේ ගිවිසුම්ඇප තැන්පත් බදු කුලී සඳහා හිලව් කිරීම. | 32700.00 |
| | 1939 | යූ.පී.කරුණාසේන මයා. | කොම්පෝස්ට් කළමනාකරණ අංගනය තුළ ගොඩගැසී ඇති කසල ගොඩගැසීම වෙනුවෙන් J.C.B.යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 169950.00 |
| | 1940 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී | 2022 අගෝස්තු මාසයේ කාර්යාලීය නිළධාරීන් විසින් ලබා ගන්නා ලද නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා මුදල් ගෙවීම. | 61300.00 |
| | 1941 | එම්.ටී.එන්.කරුණාතිලක මයා. | ගමන් වියදම් -නොවැම්බර් මාසය | 400.00 |
| | 1942 | ජී.ආර්.එස්.එස්.ගම්ලත් මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 1200.00 |
| | 1943 | ජී.ආර්.එස්.එස්.ගම්ලත් මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 1988.00 |
| | 1944 | ජී.ආර්.එස්.එස්.ගම්ලත් මිය. | ගමන් වියදම් - ඔක්තෝබර් මාසය | 388.00 |
| | 1945 | එන්.ජේ.රන්දිලිගම මයා. | රඹුක්කන මහජන පුස්තකාලය මගින් පවත්වනු ලැබූ පොත් ප්‍රදර්ශනය සම්බන්ධයෙන් ප්‍රචාරණය කිරීම සඳහා බැනර් 02ක් සාදා සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3000.00 |
| | 1946 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලීය කටයුතු සඳහා බැනර් 02ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම - කඩ කාමර ටෙන්ඩර් සඳහා | 4600.00 |
| | 1947 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලීය කටයුතු සඳහා බැනර් 02ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම.- වාගොල්ල මන්තීරුව කසල බැහැර කිරීම නැවැත්වීම සඳහා. | 3300.00 |
| | 1948 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලීය කටයුතු සඳහා බැනර් 02ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම | 3300.00 |
| | 1949 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත වෙළඳ බලපත්‍ර අයදුම්පත් 1000ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4800.00 |
| | 1950 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලයේ විවිධ මුද්‍රණ රාජකාරී සිදු කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3300.00 |
| | 1951 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත අතිකාල දීමනා වවුචර් 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3350.00 |
| | 1952 | භාෂිත ග්‍රැපික්ස් | කාර්යාලය වෙත 2022/10/11 මහා සභාවට අදාල සභා වාර්ථා සෙට් 50ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13300.00 |
| | 1953 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත වාර්ෂික වැටුප් වැඩිවීම් සටහන් කිරීම සඳහා වන පොදු 232 ආකෘති පත්‍ර 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් ගෙවීම. | 2800.00 |
| | 1954 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත දෛනික අධායම් ලේඛණ 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3000.00 |
| | 1955 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත ගමන් වියදම් වවුචර් 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3350.00 |
| | 1956 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත PS 35 ගෙවීම් වවුචර් 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3400.00 |
| | 1957 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත නිවාඩු අයදුම්පත් 1000ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3400.00 |
| | 1958 | දිසානායක පුත්‍රයෝ | කොම්පෝස්ට් අංගනයේ පොලිතීන් සම්පීඩන යන්ත්‍රය මගින් සාදන පොලිතීන් කුට්ටි පුත්කලමට රැගෙන යාමේදී ගැටගැසීම සඳහා නයිලෝන් ලණු සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5680.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1959 | සුරම්‍යා සෙරමික් | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ විදුලි අලුත්වැඩියා කටයුතු සඳහා වයර් 4m සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 580.00 |
| | 1960 | ජී.ජී.බංඩුල අජිත් කුමාර මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 4148.00 |
| | 1961 | එස්.එන්.නන්දශ්‍රී මයා. | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 700.00 |
| | 1962 | එච්.සී.කේ.හෙට්ටිගොඩ මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 6047.00 |
| | 1963 | ජී.ඒ.බංඩුසේන මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 8604.00 |
| | 1964 | කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මයා. | නිවාඩු දින වැටුප් | 8550.00 |
| | 1965 | ඩී.ජී.සී.ඩී.එස්.කුමාරි මිය. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 2366.00 |
| | 1966 | ජී.ජී.ලක්මාලි මිය. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 2336.66 |
| | 1967 | ඩී.පී.කේ.කේ.පතිරණ | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 1976.00 |
| | 1968 | ඒ.ඩබ්.ජයරත්න මයා | සභාව සතු SG.PF-7429 අංක දරණ මිට්සුබිසි L-200 ඩබල් කැබ් රථයේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 12740.00 |
| | 1969 | ආදායම් ගණකාධිකාරී ,ලංකා විදුලිබල මණ්ඩලය. | 2022 සැප්තැම්බර් හා නොවැම්බර් මාස වලට අදාලව සතිපොළ භූමියේ විදුලි බිල්පත් සඳහා මුදල් ගෙවීම. | 6017.70 |
| | 1970 | එස්.එම්.කේ.බී.සමරකෝන් | මාර්ග අංශයේ රාජකාරි කටයුතු සඳහා පිරිට් 01ක් සැපයීම වෙනුවෙන් හා කාර්යාලයේ පරිහරණය සඳහා 2.5m පල්ටි ප්ලග් 01ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3800.00 |
| | 1971 | එස්.එම්.කේ.බී.සමරකෝන් | පින්නවල අලි අනාතාගාරය අසල පිහිටි සභාව යටතේ පවත්නා පොදු වැසිකිලියේ වහලයේ අලුත්වැඩියා කටයුතු සඳහා මුදුන් ෂීට් 03ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4500.00 |
| | 1972 | එස්.එම්.කේ.බී.සමරකෝන් | බතඹුරය ක්‍රීඩාංගනයේ සිටුවන ලද සුදුහඳුල් පැල වටා ආරක්ෂිත ආවරණ සැකසීමට ඉටිරෙදි 9kg සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4950.00 |
| | 1973 | Supun Trade Center | මාර්ග අංශයේ පරිහරණය සඳහා 2022/10/12 දින කණකොළ ගපන මැෂින්තල 03ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1800.00 |
| | 1974 | එස්.එම්.කේ.බී.සමරකෝන් | ප්‍රජාශාලාවේ වැසිකිලි දොර වලට යෙදීමට ඉබි යතුරු හා කොන්ඩිපට්ටම් සැපයීම වෙනුවෙන් හා පින්නවල අලි අනාතාගාරය අසල පිහිටි පොදු වැසිකිලියේ ආලේප කිරීමට තීන්ත සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4360.00 |
| | 1975 | එස්.එම්.කේ.බී.සමරකෝන් | කාර්යාලීය කටයුතු සඳහා 7.5m Measuring tape 05ක් සැපයීම වෙනුවෙන් හා නයිලෝන් ලණු 100m රෝල් 05ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 22250.00 |
| | 1976 | දිසානායක සහ පුත්‍රයෝ | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ විවිධ රාජකාරි අවශ්‍යතා සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2546.00 |
| | 1977 | එස්.එම්.කේ.බී.සමරකෝන් | මාර්ග අංශයේ ගස් කැපීමට භාවිත කරණ චේන්සෝ යන්ත්‍රයට යෙදීමට චේන් 01ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4750.00 |
| | 1978 | එස්.එම්.කේ.බී.සමරකෝන් | කාර්මික නිළධාරි එන්.එම්.පී.එස්.නාවරත්න මියගේ රාජකාරි කටයුතු සඳහා Measuring tape 01ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1450.00 |
| | 1979 | දිසානායක පුත්‍රයෝ | නව සතිපොල භූමියේ ජලනල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1084.00 |
| | 1980 | Universal Office Auto Mation | කාර්යාලයේ සභා දේපළ විෂය භාරයේ පවත්නා පැවරුම් නියෝග එකක් හා පිඹුරුපතක් ලැමිනේට් කර ලබා දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 360.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1981 | Sarasavi Book Shop(Pvt)Ltd | රඹුක්කන හා මහජන පුස්තකාල වෙත 2022 වර්ෂයේ අයවැය වලින් වෙන්කල ප්‍රතිපාදන වලින් පොත් මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 500000.00 |
| | 1982 | එච්.එම්.ඩී.කුමාර මයා. | රඹුක්කන අශෝක ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ඇප තැන්පතු ආපසු ගෙවීම. | 1000.00 |
| | 1983 | එස්.එම්.එස්.සමරවීර මයා. | ගලි බවුසරය ලබා ගැනීම සඳහා අයකළ මුදල් ආපසු ගෙවීම. | 6860.00 |
| | 1984 | ආර්.පී.සී.කරුනාරත්න මයා | ඔක්තෝබර්,නොවැම්බර් මාස වල ආහාර සාම්පල් සඳහා නිදර්ශන ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2630.00 |
| 2022.12.08 | 1985 | පොස්ට් මාස්ටර් ජෙනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම. | 15000.00 |
| | 1986 | මුදල් භාරකරු | 2022 නොවැම්බර් මස අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියේ කම්කරු දින වැටුප් ගෙවීම. | 287280.00 |
| | 1987 | මුදල් භාරකරු | 2022 දෙසැම්බර් මස ස්ථිර සේවක වැටුප් අත්තිකාරම ගෙවීම. | 8000.00 |
| | 1988 | මුදල් භාරකරු | රඹුක්කන ප්‍රාදේශීය සභා පරිගණක ඒකකයේ කාර්යයක් සඳහා ඉන්දිරා වරුණානි තිලකරත්න මිය විසින් පෞද්ගලිකව වියදම් කළ මුදල ආපසු එම මහත්මියට ගෙවීම. | 650.00 |
| | 1989 | ඊ.එම්.එන්.ඒකනායක මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 4885.00 |
| 2022.12.12 | 1990 | එච්.එම්.සී.එම්.හේරත් මයා. | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පොදු පරිඝණක ඒකකයේ පරිඝණක අලුත් වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4900.00 |
| | 1991 | Soft Vision Lanka (Pvt)Ltd | වරිපනම් මෘදුකාංග නඩත්තු කිරීමේ සේවා ගාස්තු 2023 වර්ෂය සඳහා අලුත්කිරීම සඳහා ගෙවීම. | 10000.00 |
| | 1992 | එච්.එම්.සී.එම්.හේරත් මයා. | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ පොදු පරිඝණක ඒකකයේ පරිඝණක අලුත් වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2000.00 |
| | 1993 | Soil Tech (Pvt)Ltd | රඹුක්කන බණ්ඩාරණායක ප්‍රජා ශාලාව ඉදිකිරීමට යෝජිත භූමියේ පස් පරීක්ෂා කිරීම සඳහා ඉතිරි මුදල් ගෙවීම. | 305700.00 |
| | 1994 | එල්.එච්.චන්ද්‍රසේකර සහ සහෝදරයෝ(පුද්ගලික සමාගම) | ගබඩාව වෙත ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 151528.60 |
| | 1995 | රෙජිස්ටාර් ජෙනරාල් | 2022 පෙබරවාරි මාසයේ මුද්දර ගාස්තු උපලේඛණ සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 21700.00 |
| | 1996 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | දුරකථන බිල්පත් ගෙවීම. | 4822.39 |
| | 1997 | ලේකම් | සභාව සතු SG.PF-7429 අංක දරණ මිට්ෂුබිසි L-200 ඩබල් කැබ් රථයේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම. | 12740.00 |
| | 1998 | මුදල් භාරකරු | පෙරපැසැල් සහාය පාලිකා දීමනාව. | 19000.00 |
| | 1999 | ඩබ්.ඩී.එස්.කේ.පියතිලක මයා. | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 2096.00 |
| | 2000 | කේ.ජී.එස්.එස්.බංඩාර මයා. | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 2000.00 |
| | 2001 | ඒ.ධර්මදාස මයා. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 684.00 |
| | 2002 | ඩබ්.ඩී.එස්.කේ.පියතිලක මයා. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 4200.00 |
| | 2003 | බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරණායක මිය. | කාර්යාලීය ජල පිල්ටරය සඳහා ජලය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 600.00 |
| | 2004 | ලේකම් | රඹුක්කන ප්‍රා.ස මහා සභාව සහ වෙනත් සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය සංග්‍රහ ද්‍රව්‍ය ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබාගැනීම. | 15000.00 |
| | 2005 | සාමාන්‍යාධිකාරි සී/ස වි.සේ.ස.ස | 2022 නොවැම්බර් මාසයට අදාල ඉන්ධන බිල්පත් ගෙවීම. | 188575.00 |
| | 2006 | සාමාන්‍යාධිකාරි සී/ස වි.සේ.ස.ස | 2022 නොවැම්බර් මාසයට අදාල ඉන්ධන බිල්පත් ගෙවීම. | 192800.00 |
| | 2007 | සාමාන්‍යාධිකාරි සී/ස වි.සේ.ස.ස | 2022 නොවැම්බර් මාසයට අදාල ඉන්ධන බිල්පත් ගෙවීම. | 186730.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 2008 | සාමාන්‍යාධිකාරී සී/ස වී.සේ.ස.ස | 2022 නොවැම්බර් මාසයට අදාල ඉන්ධන බිල්පත් ගෙවීම. | 132251.00 |
| 2022.12.13 | 2009 | මුදල් භාරකරු | 2022 දෙසැම්බර් මස සහික දීමනාව | 872000.00 |
| 2022.12.14 | 2010 | බී.එන්.කේ.ගමගේ මිය. | ගමන් වියදම්- දෙසැම්බර් මාසය. | 2502.00 |
| | 2011 | ඒ.ඩබ්.ජයරත්න මයා. | ගමන් වියදම්- දෙසැම්බර් මාසය. | 1764.00 |
| | 2012 | බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරණායක මිය. | ගමන් වියදම්- දෙසැම්බර් මාසය. | 1880.00 |
| | 2013 | එච්.එෆ්.එස්.ආර්.හේනකආරච්චි මිය. | ගමන් වියදම්- දෙසැම්බර් මාසය. | 1418.00 |
| | 2014 | කේ.එෆ්.එස්.ඩී.කලුආරච්චි මයා. | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 584.00 |
| | 2015 | කේ.එෆ්.එස්.ඩී.කලුආරච්චි මයා. | ගමන් වියදම්- දෙසැම්බර් මාසය. | 1780.00 |
| | 2016 | කේ.එෆ්.එස්.ඩී.කලුආරච්චි මයා. | ගමන් වියදම්- නොවැම්බර් මාසය. | 5600.00 |
| | 2017 | ඩබ්.ඩී.එස්.කුමාර මයා. | නිවාඩු දින වැටුප් | 1663.25 |
| | 2018 | ඩබ්.ඩී.සංජීව මයා. | නිවාඩු දින වැටුප් | 1663.25 |
| | 2019 | ඩබ්.ඩී.සංජීව මයා. | නිවාඩු දින වැටුප් | 4989.75 |
| | 2020 | ඩබ්.ඩී.සංජීව මයා. | නිවාඩු දින වැටුප් | 1663.25 |
| 2022.12.15 | 2021 | Kegalle Distributers (Pvt)Ltd | ආදාහනාගාරය වෙත 37.5Kg ලිට්රෝ ගෑස් සිලින්ඩර 05ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 110664.00 |
| | 2022 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී | මෙම සභාවේ සේවය කරන කේ.එස්.පියසේන මයාගේ ත්‍රෛමාසික දුම්රිය වාර ප්‍රවේශ පත්‍රය සඳහා මුදල් ගෙවීම. | 3600.00 |
| 2022.12.19 | .2023 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | දේශීය ණය සහ සංවර්ධන අරමුදල.සතිපොල ණය සඳහා ලබාගෙන ඇති අරමුදලේ 2022/10/01 සිට 2022/12/31 දක්වා හතරවන කාර්තුව සඳහා නය වාරිකය හා පොළිය ගෙවීම. | 5320.00 |
| | 2024 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | වැසිජලය අපවහන ව්‍යාපෘතිය සඳහා වූ ණය මුදල 2022/10/01 සිට 2022/12/31 දක්වා හතරවන වාරිකය සඳහා ණය හා පොළිය ගෙවීම. | 457114.77 |
| | 2025 | ලේකම් | රඹුක්කන ප්‍රාදේශීය සභා මහා සභාව හා වෙනත් සංග්‍රහ කටයුතු සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම. | 19067.50 |
| | 2026 | එල්.ආර්.ඒ.ඩී.කුමාරිහාමි මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 4900.00 |
| | 2027 | සභාපති,රඹුක්කන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ගලි තැන්පතු ආධායමට ගැනීම. | 131170.00 |
| | 2028 | පී.කේ.ජී.ඩී.එස්.ගුණරත්න මයා. | 2022.08.02 දින සංගීත ප්‍රසංගයක් සඳහා බතබුරය ක්‍රීඩාංගනය වෙන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10000.00 |
| | 2029 | Director Genaral Of Pension | 2022 ජූලි ,අගෝස්තු හා සැප්තැම්බර් මාස සඳහා විශ්‍රාම වැටුප් දායක බිල්පත් ගෙවීම. | 38113.71 |
| | 2030 | Universal Office Automation | රාජකාරී හැඳුණුම්පත් සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 11200.00 |
| | 2031 | ඩී.ටී.බාලසූරිය මයා. | ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලය වෙත ඔක්තෝබර් මස පුවත්පත් බිල්පත් ගෙවීම. | 12380.00 |
| | 2032 | ඩී.එම්.ටී.නිරෝෂණී මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 5000.00 |
| | 2033 | පී.ඩී.ඩබ්.සී.කුමාරිහාමි මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 5000.00 |
| | 2034 | බී.එන්.එන්.සුරංගිකා මිය. | ගමන් වියදම් - නොවැම්බර් මාසය. | 350.00 |
| | 2035 | බී.එන්.එන්.සුරංගිකා මිය. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 2376.00 |
| | 2036 | සී/ස වි.සේ.ස.ස | 2022 පොදු අරමුදල් .වත්තේගම පන්සල් මාර්ගය කැඩී ගිය ස්ථාන සඳහා පැති බැම්ම ඉදි කිරීම.අවසන් බිල්පත පියවීම. | 268355.54 |
| 2022.12.21 | 2037 | මුදල් භාරකරු | 2022 දෙසැම්බර් මස ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 4928991.42 |
| | 2038 | වී.රාජපක්ෂ | කාර්යාලය වෙත ක්ෂේත්‍ර ආධායම් වරිපනම් බදු ගෙවීමේ ආකෘති පත්‍ර පොත් 20ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගවීම. | 17000.00 |
| | 2039 | Sithara Printers | රඹුක්කන ආයුර්වේද මද්‍යස්ථානය වෙත නැවත රෝගීන් පැමිණෙන විට ලබා දෙන කාඩ් පත් 1000ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2500.00 |
| | 2040 | Sithara Printers | රඹුක්කන ආයුර්වේද මධ්‍යස්ථානය වෙත බෙහෙත් වට්ටෝරු පත්‍ර 3000ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4500.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 2069 | මුදල් භාරකරු | 2022 අගෝස්තු මස ගරු සභාපති තුමාගේ පෞද්ගලික ලේකම් දීමනාව. | 16800.00 |
| | 2070 | මුදල් භාරකරු | 2022 සැප්තැම්බර් මස ගරු සභාපති තුමාගේ පෞද්ගලික ලේකම් දීමනාව. | 16800.00 |
| | 2071 | මුදල් භාරකරු | 2022 ඔක්තෝබර් මස ගරු සභාපති තුමාගේ පෞද්ගලික ලේකම් දීමනාව. | 16800.00 |
| | 2072 | මුදල් භාරකරු | 2022 නොවැම්බර් මස ගරු සභාපති තුමාගේ පෞද්ගලික ලේකම් දීමනාව. | 16800.00 |
| | 2073 | වී.ආර්.එල්.ප්‍රේමසිරි | අතිකාල දීමනා - ඔක්තෝබර් මාසය. | 16800.00 |
| | 2074 | වී.ආර්.එල්.ප්‍රේමසිරි | අතිකාල දීමනා - නොවැම්බර් මාසය. | 16800.00 |
| | 2075 | සුරම්‍යා සෙරමික් | කාර්යාලීය විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8900.00 |
| | 2076 | පෝස්ට් මාස්ටර් ජෙනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම. | 15000.00 |
| | 2077 | එච්.එම්.සී.එම්.හේරත් මයා. | ගිණුම් අංශයේ 17 වන පරිගණකයේ අලුත්වැඩියාවක් වෙනුවෙන් ගෙවීම. | 2000.00 |
| | 2078 | එච්.එම්.සී.එම්.හේරත් මයා. | ගිණුම් අංශයේ 17 වන පරිගණකයේ අලුත්වැඩියාවක් වෙනුවෙන් ගෙවීම. | 3800.00 |
| | 2079 | එච්.එම්.සී.එම්.හේරත් මයා. | කාර්යාලීය පරිගණක අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 39900.00 |
| | 2080 | Sri lanka State Trading (Gen)Cop.Ltd | ගබඩාව වෙත 24 ෆයිල් ටැග් 2000ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9857.20 |
| | 2081 | Central Stationerles | ගබඩාව වෙත බයින්ඩර් ගම් බෝතල් 50ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5600.00 |
| | 2082 | Paperline Trading (Pvt)Ltd | ගබඩාව වෙත අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් හා ගොඩනැගිලි අයදුම්පත් බහාලන ලිපි කවර මුද්‍රණය කිරීමට වර්ණ ලිපිට ගොණු කවර 200ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 27485.00 |
| | 2083 | ඩබ්.ජේ.ටී.මධුශංක මයා. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 884.00 |
| | 2084 | ජේ.ඩබ්.ජයරත්න මයා. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 2236.00 |
| | 2085 | ජේ.එච්.අටුලුගම මිය. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය. | 1790.00 |
| | 2086 | ජේ.ඩී.ජේ.චන්ද්‍රසේන මයා. | නව පළමු වෙලද සංකීර්ණය බිම් මහළ අංක 10 කඩ කාමරය සඳහා ලංසු ඉදිරිපත් කිරීමට තැන්පත් කළ ටෙන්ඩර් ඇප මුදල් ආපසු ගෙවීම. | 10000.00 |
| | 2087 | බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරනායක මිය. | අතිකාල දීමනා - දෙසැම්බර් මාසය. | 3074.00 |
| | 2088 | නත්තඹුර වසමේ වැඩිහිටියන්ගේ සමිතිය. | 2022 පොදු අරමුදල්.කාඩවට්ටිය සමගි මාවත කොන්ක්‍රීට් කිරීම.අවසන් බිල්පත ගෙවීම. | 135000.00 |
| | 2089 | සමාධි ග්‍රාමීය වැඩිහිටි සමිතිය. | 2022 පොදු අරමුදල් .දැලිවල තිස්ස විද්‍යාලය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.අවසන් බිල්පත ගෙවීම සිදු කිරීම. | 134916.27 |
| | 2090 | සමාධි ග්‍රාමීය වැඩිහිටි සමිතිය. | 2022 පොදු අරමුදල් . මීරිහාගොඩ පොදු සුසාන භූමියේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම.අවසන් බිල්පත ගෙවීම සිදු කිරීම. | 135000.00 |
| | 2091 | පී.කේ.ජී.ඩී.එස්.ගුණරත්න මයා. | 2022.12.10 දින බතඹුරය ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ඇප තැන්පතු ආපසු ගෙවීම. | 10000.00 |
| | 2092 | Sri Lanka Insurance Coroporation LTD | සභාව සතු SG.RX-4388 අංක දරණ ට්‍රැක්ටර් ටේලරයේ ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 23112.06 |
| | 2093 | Sri Lanka Insurance Coroporation LTD | සභාව සතු SG.RE-2261 අංක දරණ 350 DI කසල ප්‍රවාහන ට්‍රැක්ටර් ටේලරය ඉදිරියට වර්ෂයක් සඳහා රක්සනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 22585.41 |
| | 2094 | Sri lanka State Trading (Gen)Cop.Ltd | විදුලි අංශයේ රාජකාරි සිදු කරන සේවක මහතුන් වෙත Safety boots ජෝඩු 02ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 11960.00 |
| | 2095 | හිතමිතුරු ට්‍රේඩ් කම්පැනි | ආදාහනාගාරයේ සේවය කරන සේවක මහතුන් වෙත මාස්ක් පෙට්ටි 01ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 650.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 2096 | එස්.එම්.කේ.බී.සමරකෝන් | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පොලිතීන් සම්පීඩන යන්ත්‍රය මගින් සාදන පොලිතීන් කුට්ටි ගැටගසා තැබීම සඳහා ලණු සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25000.00 |
| | 2097 | ඒ.කේ.ඩබ්.පුෂ්පකුමාර මයා. | රඹුක්කන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ පරිහරණය සඳහා හීටර් ජෝගුවක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4250.00 |
| | 2098 | පී.පී.සී.කරුණාරත්න මයා. | 2022 වර්ෂයේ මාර්තු මාසය වෙනුවෙන් ලබා ගත් ආහාර සාම්පල සඳහා ගිය වියදම් පියවීම. | 2565.00 |
| | 2099 | එච්.ඒ.එෆ්.හක් මයා. | නව වෙළඳ සංකීර්ණයේ බිම් මහළ වම් පස තරප්පු පෙළ යට පිහිටි හිස් ඉඩකඩ සඳහා ලංසු ඉදිරිපත් කිරීමට තැන්පත් කළ ටෙන්ඩර් ඇප මුදල් ආපසු ගෙවීම. | 10000.00 |
| | 2100 | එස්.එම්.කේ.බී.සමරකෝන් | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ විවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4690.00 |
| | 2101 | එස්.එම්.කේ.බී.සමරකෝන් | විදුලි පංකාවක් හා ටේප් 01ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4200.00 |
| | 2102 | ඒ.කේ.ඩබ්.පුෂ්පකුමාර මයා. | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ විවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3370.00 |
| | 2103 | දිසානායක පුත්‍රයෝ | රඹුක්කන ප්‍රාදේශීය සභාවේ විවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4925.00 |
| | 2104 | ඒ.කේ.ඩබ්.පුෂ්පකුමාර මයා. | රඹුක්කන මහජන පරික්ෂක කාර්යාලය වෙත මකුළු දැල් කඩන බ්‍රෂ් 01ක් හා ඩස්බින් 01ක් හා ගබඩාව වෙත ටොයිලට් බ්‍රෂ් 10ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2920.00 |
| | 2105 | සූරමා‍‍ා සෙරමික් | රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසලේ පැවති රාත්‍රී කඳවුර සඳහා විදුලිය සැපයීමට අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3870.00 |
| | 2106 | ඒ.කේ.ඩබ්.පුෂ්පකුමාර මයා. | 2022 වසරේ ප්‍රා.ස පෙර පැසැල් සඳහා ත්‍යාග (ළමා කුඩ) 121 ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 124630.00 |
| | 2107 | සූරමා‍‍ා සෙරමික් | කාර්යාලීය පරිඝණක 02ක් සඳහා වයර් කෝඩ් 02ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4850.00 |
| | 2108 | ඩබ්.එන්.කුමාරසිංහ මයා. | ජල නළ එලීමට අදාලව තැන්පත් කළ ඇප මුදල ආපසු ගෙවීම. | 2000.00 |
| | 2109 | S.B.Printers (Pvt)ltd | කාර්යාලය වෙත වරිපනම් බදු කුලී ලේඛණ 05ක් හා ගබඩා ලැබීම් පොත් 05ක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 16755.00 |
| | 2110 | එන්.ජේ.රන්දිලිගම | කාර්යාලය වෙත අතිකාල අයදුම්පත් 500ක් හා ඉල්ලුම් පත්‍රය සඳහා ඇමුණුම් 500ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4900.00 |
| | 2111 | ටී.එම්.ඩී.ඩී.බී.තෙන්නකෝන් මයා | 2022.11.27 දින බතඹුරය ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීම. | 1000.00 |
| | 2113 | පී.ඩබ්.එස්.එම්.කරුණාතිලක මයා. | ජල නළ එලීමට අදාලව තැන්පත් කළ ඇප මුදල ආපසු ගෙවීම. | 2000.00 |
| | 2114 | එස්.සේනක ඉලංගන්තිලක මයා. | නඩු අංක 8977/ඉඩම් නඩුව සඳහා පෙනී සිටීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1500.00 |
| | 2115 | එස්.එස්.ඉලංගන්තිලක | 8740/L නඩුවට 2022/10/25 දින පෙනී සිටීම වෙනුවෙන් සේවා ගාස්තු ගෙවීම. | 1500.00 |
| | 2116 | Sri Lanka Insurance Coroporation LTD | සභාව සතු SG.RV - 8542 අංක දරණ ට්‍රැක්ටර් ටේලරයේ ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10197.37 |
| 2022.12.23 | 2117 | මුදල් භාරකරු | මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වූ අයගේ සංග්‍රහ කටයුතු සඳහා විෂය නිළධාරී බී.අයි.එම්.ඩී.කේ.බණ්ඩාරණායක මිය විසින් පෞද්ගලිකව වියදම් කළ මුදල් ආපසු ගෙවීම. | 7130.00 |
| | 2119 | Sri Lanka Insurance Coroporation LTD | සභාව සතු SG.37-4904 අංක දරණ ට්‍රැක්ටරය 2022.11.27 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 6979.61 |

| | | | | |
|---|---|---|---|---|
| | 2120 | එච්.ඒ.එෆ්.හක් මයා. | නව පළමු වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලයේ අංක 14 කඩ කාමරයට යාබදව හිස් ඉඩකඩ ටෙන්ඩර් කිරීමට ලංසු ඉදිරිපත් කිරීමට තැන්පත් කළ ටෙන්ඩර් ඇප මුදල ආපසු ගෙවීම. | 10000.00 |
| | 2121 | බී.පී.එන්.යූ.කේ.ද සිල්වා මයා. | පොදු වෙළඳපළ අංක 37 මාළු කඩ කාමරය මදහා 2022 වර්ෂයට ගිවිසුම් ඇප ගෙස තැන්පත් කළ මුදල් ගෙවීම. | 378904.50 |
| | 2122 | බී.පී.එන්.යූ.කේ.ද සිල්වා මයා. | පොදු වෙළඳපළ අංක 37 මාළු කඩ කාමරය මදහා 2022 වර්ෂයට ටෙන්ඩර් ඇප ගෙස තැන්පත් කළ මුදල් ගෙවීම. | 23500.00 |
| | 2123 | එස්.එස්.ඉලංගන්තිලක මයා. | 8084/ඉඩම් නඩුව සඳහා 2022/11/01 දින පෙනී සිටීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4000.00 |
| | 2124 | යුනයිටඩ් මෝටර්ස් ලංකා පී.එල් .සී. | සභාව සතු SG.PF-7429 අංක දරණ මිට්ෂුබිසි L-200 ඩබල් කැබ් රථයේ අලුත්වැඩියාවක් සඳහා මුදල් ගෙවීම. | 117022.17 |
| | 2125 | යුනයිටඩ් මෝටර්ස් ලංකා පී.එල් .සී. | සභාව සතු SG.PF-7429 අංක දරණ මිට්ෂුබිසි L-200 ඩබල් කැබ් රථයේ KM 150000 වාර සේවාව වෙනුවෙනු අලෙවි නියෝජිත ආයතනයට මුදල් ගෙවීම. | 65926.43 |
| | 2126 | Sri Lanka Insurance Coroporation LTD | සභාව සතු SG.PF-7429 අංක දරණ මිට්ෂුබිසි L-200 ඩබල් කැබ් රථයේ 2022/12/8 දිනෙන් ඉදිරියට රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 77639.87 |
| | 2127 | Sri Lanka Insurance Coroporation LTD | සභාව සතු SG.37-8242 අංක දරණ 240 මැෂිෆර්ගියුසන් ට්‍රැක්ටර් රථය 2022/11/27 දිනෙන් ඉදිරියට වර්ෂයක් සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 7849.26 |
| | 2128 | භාෂිත ග්‍රැපික්ස් | කාර්යාලය වෙල මහා සභා වාර්ථා සෙට් 50ක් මුද්‍රණය කර දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9800.00 |
| | 2129 | එන්.ජේ.රන්දිලිගම මයා. | කාර්යාලය වෙත අආදාහනාගාරය වෙන් නිරමේ අයදුම්පත් 500ක් මුද්‍රණය කරදීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3000.00 |
| | 2130 | වී.රාජපක්ෂ මයා. | රාජකාරී නිළ මුද්‍රාවක් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 400.00 |
| | 2131 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | 2022 පොදු අරමුදල්.කුරෙම්පොළ පිළිකුඹුර වෙළ මැද මාර්ලය සංවර්ධනය කිරීම සඳහා ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 99150.00 |
| | 2132 | එච්.එම්.අයි.ජේ.කුරුකුලසූරිය මයා. | 2022 පොදු අරමුදල්.හලාගිරිය පන්සල අසලින් මායිම්වන මාර්ගය සංවර්ධනය කිරීම ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 99750.00 |
| | 2133 | පී.එම්.බෝගහවත්ත මයා. | මෙම සභාව මගින් පවත්වාගෙන යනු ලබන හේවාදිවෙළ ආයුර්වේදය සඳහා වාර්ෂික ගොඩනැගිලි කුලී ලබා දීම. | 30000.00 |
| 2022.12.27 | 2134 | එල්.පී.එල් .මැණිකේ මිය. | කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ ගොඩගාසී ඇති කසල පුත්තලමට රැගෙන යාම සඳහා ලොරි රථය දින 02ක් යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 116000.00 |
| | 2135 | එච්.ඒ.එස්.ආර්.හේනකආරච්චි මිය. | ගමන් වියදම්- දෙසැම්බර් මාසය. | 350.00 |
| | 2136 | ඒ.එම්.පී.ජයසිංහ මයා. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය | 400.00 |
| | 2137 | එස්.ජේ.එස්.සමරසිංහ මයා. | ගමන් වියදම් - දෙසැම්බර් මාසය | 400.00 |

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**තීරණය -**

2022.12.01 සිට 2022.12.27 දක්වා උපලේඛන අංක 01හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

ඉ.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ජී මල්ලිකා මැතිතුමිය

1. පුවක්මොටේ වසමේ පුවක්මොටේ සුසාන භූමිය සුද්ධ කිරිම සහ එම ස්ථානයේම පිහිටා ඇති ළිඳ සුද්ද කරගැනිම සඳහා JCB යන්ත්‍රය ඉල්ලා ගැනිමට යෝජනා කරමි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ පියරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

පුවක්මොටේ සුසාන භූමිය වල්වැදි ඇති බැවින් JCB යන්ත්‍රය යොදා එය සුද්ද කරගැනිමට අවශ්‍ය බවත් සුසාන භූමිවල සැදීම සඳහා සභාව විසින් ලබාදෙන කොස් පැළ සිටුවීම සඳහා සුසාන භූමියේ වළවල් කපාගැනිමට අවශ්‍ය බවත් ගරු මල්ලිකා මැතිතුමිය පවසන ලදි. ඒ වගේම අපදා කළමනාකරන මධ්‍යස්ථානය ළග වැසිකිලි දෙකක් ඇති අතර ජලය නොමැති නිසා එය භාවිතයට ගත නොහැකි මට්ටමට පත්ව ඇති බවත් ඒ ආසන්නයේ ඇති පොදු ළිඳ නැවත සකස් කරගත යුතු බවත් ගරු මල්ලිකා මැතිතුමිය විසින් පවසන ලදි.

- ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ඒ සඳහා සුදුසු ස්කේයාවේටර් යන්ත්‍රයක් සුදුසු බවත් JCB යන්ත්‍රය යොදා එම කටයුතු සිදුකරගත හැකි නම් එම කටයුතු දිනයක් යොදාගෙන සිදුකිරිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

JCB යන්ත්‍රය යොදා එම කටයුතු සිදුකරගැනිමට තීරණය විය.

## ඉ).II.යථා පරිදි කල්දී නොමැති යෝජනා

## ඉ).II.01

- ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

නව දෙවන වෙළඳ සංකීර්ණයේ පහත අංක එක කඩ කාමරයට යාබඳව ඇති පඩි පෙළ යට හිස් ඉඩ ප්‍රමාණය ජේ.පි.අනුර රංජිත් කුමාර මහතා විසින් බදු පදනම මත ලබාගැනිමට ඉල්ලිමක් සිදුකර ඇත. බදු පදනම මත ලබාදීමට නම් ටෙන්ඩර් කර මිල ගණන් කැඳවිය යුතු අකර මාසික කුලී පදනම මත ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා

ජේ.පි.අනුර රංජිත් කුමාර මහතාට බදු ලබාදී ඇති කොටසට සාපේක්ෂව ඒ සඳහා අය කල යුතු මුදල කොපමණද යන්න ගරු මන්ත්‍රීතුමන් විසින් විමසන ලදි.

- ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

ඒ සඳහා ආදායම් පරීක්ෂක මගින් තක්සේරු වාර්තාවක් ලබාගත යුතු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

මාසික කුලී පදනම් මත ලබාදීමට තීරණය විය.

# ඉ).II.02

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

නො 42, ගොරොක්ගහකැලේ, මොළගොඩ පදිංචි ඩී.පී.සමරසිංහ මහතා විසින් අංක 48 දරණ ඉඩම් කැබැල්ල සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කරමින් එම ඉඩම් කොටස පදිංචිය සඳහා නිරවුල් කරදෙන ලෙසට ඉල්ලීමක් සිදු කර ඇත. කාර්මික නිලධාරි විසින්ද එය පරීක්ෂා කර එහි සුසාන භූමියක් නොමැති බවත් එම වසම සඳහා වෙනත් සුසාන භූමියක් පවතින බවටත් වාර්තා කර ඇත. එම ඉඩම තුළ සුසාන භූමියක් ලෙස භාවිතා කර නොමැති බව ප්‍රාදේශීය ලේකම්තුමා වෙත දන්වා යැවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

අංක 48 දරණ ඉඩම් කොටසේ සුසාන භූමියක් ලෙස සභාව සතුව පවතිනවාද? යන්න ප්‍රාදේශීය ලේකම්තුමා විසින් විමසීමක් සිදු කර ඇති බවත් එම ඉඩම් කොටස ආදායම් පරිපාලකගේ වාර්තාවට අනුව මෙම ඉඩම සුසාන භූමියක් ලෙස භාවිතා කර නොමැති බවත් මෙම ගොරොක්ගහකැලේ ප්‍රදේශයේ වෙනත් සුසාන භූමියක් පවතින බවද දන්වා ඇත.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.සුරංග සම්පත් ගුණතිලක මැතිතුමා**

මෙම ඉඩම සභාවට අයත් දේපලක් ලෙස 2019 වර්ෂයේදී යෝජනාවක් මඟින් සම්මත කර ගත් බවත් මෙම ප්‍රදේශය තුළ සුසාන භූමි දෙකක් දක්නට ලැබෙන බවත් අංක 48 දරණ ඉඩම තුළ ඔවුන් වසර 50 පමණ කාලයක සිට පදිංචිව සිටින අතරම එම ඉඩම සුසාන භූමියක් ලෙස මිහිදන් කටයුතු සිදු කර නොමැති බවද ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

2019 වර්ෂයේදී මේ සම්බන්ධව ගරු අනුලාවති මැතිතුමිය පවා අදහස් දක්වා ඇති අතර ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ පිඹුරු තුළ මෙම ඉඩම සුසාන භූමියක් ලෙස දක්වා ඇති බවත් වසර 50 පමණ කාලයක සිට මෙම පිරිස මෙහි ජීවත්ව සිටින බවත් සුසාන භූමියක් ලෙස භාවිතයට ගෙන නොමැති බවත් දන්වා ඇති අතර වැඩි දුරටත් විමසා සිටින්නේ මෙම ඉඩම සුසාන භූමියක් ලෙස පවත්වාගෙන යනවාද නැතිනම් එයින් බැහැර කරනවාද යන වග ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සිරිසේන මැතිතුමා**

මෙම ඉඩමේ ප්‍රමාණය අනුව එහි ජීවත්වන දෙපිරිසටම ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.සුරංග සම්පත් ගුණතිලක මැතිතුමා**

මෙම ඉඩමෙහි වසර 50 පමණ සිට දෙදෙනෙකු පදිංචි වී සිටින අතර එහි ප්‍රමාණය සම්බන්ධව පැහැදිලිව පැවසිය නොහැකි බව ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

මෙම ඉඩමේ අයිතිය සම්බන්ධව නොදන්නා බවත් ඉඩම සුසාන භූමියක් ලෙස නම් කර ඇතත් භාවිතයට ගෙන නොමැති බවත් මෙහි ජීවත්වන පිරිසට දීමනා පත්‍ර ලබාදීමේදී මෙම ගැටළුව මතුව ඇති අතර සුසාන භූමියක් ලෙස භාවිතා නොකරන බව දන්වා යැවීම සුදුසු නොවන්නේද යන්න ගරු සභාපතිතුමන් විසින් විමසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා

මෙම ඉඩම සුසාන භූමියක් ලෙස භාවිතා කර නොමැති නම් දීමනා පත්‍ර ලබාදීමට ගැටළුවක් නොමැති බව දන්වා යැවීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

සුසාන භූමියක් ලෙස භාවිතා කර නොමැති බවත් එම ඉඩම සඳහා දීමනා පත්‍ර ලබාදීම සුදුසු බව ප්‍රාදේශීය ලේකම්තුමා වෙත දන්වා යැවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු කේ.කේ.ඩී. වික්‍රමසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සුසාන භූමියක් ලෙස භාවිතා කර නොමැති බව ප්‍රාදේශීය ලේකම්තුමා වෙත දන්වා යැවීමට තීරණය විය.

## ඉ).II.03

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

සභාව සතු මල්බෙරිවත්ත පොල් එලදාව භූමිය මල්බෙරිවත්ත සුභසාධක සංගමය විසින් වාර්ෂිකව බදු ලබාගන්නා අතර ලිපියක් මඟින් දන්වා ඇත්තේ භූමිය තුළ පොල් ගස් 14 පමණක් ඇති බවත් පොල් කැඩීම සඳහා රු.150.00 පමණ මුදලක් වැයවන අතර පොල්වල මිල ගණන් කාලයෙන් කාලයට වෙනස්වන නිසාත් සභාව වෙත ගෙවිය යුතු බදු මුදල අඩුකර දෙන මෙන් ඉල්ලීමක් සිදු කර ඇත. එමෙන්ම 2023 වර්ෂය සඳහා බදු ලබාගැනිමට කිසිම ලංසුකරුවෙකු ඉදිරිපත් නොවුණ බවත් දක්වා ඇත. 2022 වර්ෂයේ බදු මුදල රු.12420.00 වන අතර ආදායම් පරීක්ෂකගේ නිරීක්ෂණ වාර්තාවන්ද මේ සමඟ ඉදිරිපත් කර ඇත.පවතින තත්වය මත බදු මුදල අඩු කිරිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

බදු මුදල අඩු කිරිම තීරණය විය.

## ඉ).II.04

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

කෙසෙල්වතුගොඩ සුසාන භූමිය බදු ලබාගත් ඒ.එම්.එස්.පී.කේ.වීරසිංහ මහතාගේ බිරිඳවන එච්.එම්.මාලනී හේරත් මිය 2022.12.22 දින ලිපියක් ඉදිරිපත් කරමින් එලදා බදු අඩුකර දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇත. ආදායම් පරීක්ෂකගේ නිරීක්ෂණ වාර්තාවලට අනුව එලදාව ලබාගත හැකි පොල් ගස් 10 ක් පමණ ඇති බවත් 2022 වර්ෂයේ ටෙන්ඩර් මුදල රු.10,560.00 වන අතර 2023 වර්ෂය සඳහා එම මුදල රු.9550.00 වාර්ෂික බදු මුදලකට ලබාදිය හැකි බවත් දන්වා ඇත.එම වාර්ෂික බදු මුදල අඩු කිරිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු උප සභාපති එස්.එම්.නිමල් ජයවර්ධන මැතිතුමා

සභා දේපළ බදු දීමේදි වැඩි මුදල් ප්‍රමාණයන් ඉදිරිපත් කරන නිසා සභා දේපල බදුගැනිමට අකමැත්ත දක්වන බැවින් සභාවට එන ආදායම් අඩුවී ඇති බව ගරු උප සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

බදු මුදල රු.9550.00 දක්වා අඩු කිරිමට තීරණය විය

## ඉ).II.05

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

අංක ඒ.49/2 පල්අරඹේගම මොළගොඩ ලිපිනයෙහි පදිංචි එම්.ඒ.නන්දසේන මහතා විසින් මොළගොඩ පොදු වැසිකිළිය පැවති භූමියේ තාවකාලික පෙට්ටි කඩයක් පවත්වා ගෙන යන බවත් ඒ සඳහා මසකට සභාව වෙත රු.500.00 ක බදු මුදලක් ගෙවන බවත් බදු ගිවිසුම් කාලය 2023.01.23 දිනෙන් අවසන් වන බැවින් එම පෙට්ටි කඩය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා බදු කාලය දීර්ඝ කරදෙන මෙන් ඉල්ලීමක් සිදු කර ඇත. එම කඩය පවත්වාගෙන යාම සඳහා බදු කාලය දීර්ඝ කරදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.යූ.පී.කේ.ජේ.බාලසූරිය මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

බදු කාලය දීර්ඝ කිරීමට තීරණය විය.

## ඉ).II.06

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මහතා විසින් 2022.12.18 දින ප්‍රජා ශාලාව මුදල් ගෙවා වෙන් කරගනු ලැබුවත් එදින එම වැඩසටහන නොපැවැත්වූ බැවින් ඒ සඳහා ගෙවන ලද මුදල් නැවත ඉල්ලා ඇති අතර එම මුදල් ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

නැවත මුදල් ලබාදීමට තීරණය විය.

## ඉ).II.07

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

ගබ්බල කොටවැල්ල ශ්‍රී මහා මහේන්ද්‍රාරාමය විහාරාධිපති හිමියන් විසින් එම විහාරස්ථානයේ චෛත්‍ය රාජයාණන් වහන්සේ වටා පස් කපා ඉවත් කර මළුව සකස් කිරිම මෙන්ම විහාරස්ථානයට ඇතුළුවන මාර්ගයේ පැති බැම්මක් ඉදිකිරිම සඳහා එහි ඉවුර සුදුසු පරිදි සකස් කරගැනිම සඳහා JCB යන්ත්‍රය ලබා දෙන මෙන් ඉල්ලීමක් සිදුකර ඇති අතර එය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී. රසික සුමේද ආරියරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

JCB යන්ත්‍රය ලබාදීමට තීරණය විය.

# ඉ).II.08

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

රඹුක්කන පොලිස් ස්ථානය සඳහා අප සභාව සතු ගලි බවුසරය ලබාගැනීම අවශ්‍ය බව දන්වා ඇති අතර එය මුදල් අයකර ලබාදෙනවාද නැතිනම් නොමිලේ ලබාදෙනවාද යන්න විමසීමක් කර ඇති අතර නොමිලේ ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

මුදල් අය නොකර ලබාදීමට තීරණය විය.

# ඉ).II.09

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

මුංකොටුව තරුණ කැල විසින් මුංකොටුව මාර්ගය මුංකොටුව ග්‍රාමයෙහි සිට මියගිය ලාප්ස් කෝප්‍රල් චමින්ද කුමාර මාවත යන නමින් නම් කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇති අතර එලෙස මාර්ගයක නම වෙනස් කිරීම සඳහා ගැසට් කළ යුතු බවද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

මාර්ගයක නම වෙනස් කිරීම සඳහා ගැසට් කළ යුතු බැවින් ඒ බව දන්වා යැවීමට තීරණය විය.

# ඉ).II.10

❖ ගරු සභාපති අතුල හඳගම

රඹුක්කන ඊරියගොල්ල පදිංචි කේ.ඒ.නිල්මිණි දිල්රුක්ෂි මහත්මිය විසින් දන්වා ඇත්තේ තමන් දරුවන් තිදෙනෙකු සිටින අඩු ආදායම්ලාභී වැන්දඹු කාන්තාවක් වන බවත් වැඩිමහල් පිරිමි දරුවා අධ්‍යාපන කටයුතු අවසන් කර ඇති අතර බාල දියණිය සහ පුතු පාසල් යන වයසේ පසුවන බවය. කුඩා පුතු පිළිකා රෝගියෙක් වන බැවින් ඔහුගේ ප්‍රතිකාර කටයුතු සඳහාද විශාල මුදලක් දැරීමට සිදුව ඇති බවත් රැකියාවක් සඳහා යාමේ වතාවරණයක් නොමැති බවත් පවසයි. මේ තත්වය තුළ දරුවන් දෙදෙනාගේ අධ්‍යාපන කටයුතු සිදු කිරීමට අපහසු බැවින් ඒ සඳහා යම් උපකාරයක් ඉල්ලා සිටී. අතර එම දරුවන් දෙදෙනා සඳහා රු.2000.00 බැගින් අධ්‍යාපන ආධාර ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ඒ.පී තිලකරත්න මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අධ්‍යාපන ආධාර ලෙස රු.2000.00 බැගින් ලබාදීමට තීරණය විය.

## ඉ).II.11

❖ ගරු සභාපති අතුල හඳගම

2023 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටින සිසු දරු දැරියන්ගේ සිංහල භාෂා විෂයේ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාව මඟින් 2023.01.16 වන සඳුදා දින පැවැත්වීමට සූදානම් කර ඇති සිංහල සම්මන්ත්‍රණයේ සම්පත් දායකත්වයට සහ සිසු දරු දැරියන් වෙනුවෙන් සංග්‍රහ කටයුතු සඳහා පහත සඳහන් ඇස්තමේන්තු මුදල පහත දැක්වේ. එම මුදල පසුගිය වර්ෂයේ අයවැය තුළ තිබුණ මුදලක් බැවින් එම මුදල අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා ස්ථිර කරන ලදී.

1. සම්පත්දායක දීමනාව සහ නිබන්ධන සඳහා - රු.25,000.00
2. සිසුන් 200ක් සඳහා සංග්‍රහ වියදම් සඳහා - රු.29,200.00
3. සම්පත්දායක සංග්‍රහ වියදම් සඳහා - රු.2,000.00

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ඒ සඳහා වියදම් දැරීමට තීරණය විය.

## ඉ).II.12

❖ ගරු සභාපති අතුල හඳගම

රඹුක්කන සතිපොළ භූමියේ අංක 44 කඩ කාමරය කේ.එම්.සුදු බණ්ඩා යන අයට අයිතිය ඇති අතර ඔහු මියගොස් ඇති බැවින් කේ.එම්.ජයතිස්ස යන අයට පවරා දෙන මෙන් ඉල්ලීමක් සිදු කර ඇත. මෙම මියගිය කේ.එම්.සුදු බණ්ඩා යන අයට දරුවන් සිවුදෙනෙකු වන අතර මේ සම්බන්ධයෙන් ඔවුන්ගේද විරුද්ධත්වයක් නොමැති බව දන්වා ඇත. කේ.එම්.ජයතිස්ස මහතා හට කඩ කාමරය පවරාදීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

කේ එම්.ජයතිස්ස මහතා හට කඩ කාමරය පවරාදීමට තීරණය විය.

## ඉ).II.13

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

වලල්ගොඩ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් තම සංවිධානය තුළ සාමාජිකයින් 50 පමණ සිටින බවත් ඔවුන්ට සාමාජික මුදල් පවා ගෙවාගැනීමට සඳහා ආදායම් මාර්ගයක් නොමැති බවත් පවසා යම් ආධාර මුදලක් ලබා දෙන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇත. ආධාර මුදලක් ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.ජී.එස්.පී.කේ.රණවීර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

රු.10000.00 මුදලක් ලබාදීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවීමට තීරණය විය.

## ඉ).II.14

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

මොලගොඩවත්ත,මොලගොඩ පිහිටි සුහද එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය විසින් මොලගොඩ සිට ලසන්තාගම දක්වා මාර්ගය සුද්ද කර දෙපස කාණු පද්ධතිය සකස්කරගැනිම සඳහා JCB යන්ත්‍රය ඉල්ලා සිටින අතර එය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**තීරණය -**

JCB යන්ත්‍රය ලබාදීමට තීරණය විය.

## ඉ).II.15

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

රඹුක්කන දියසුන්නත පවත්වාගෙන ගිය ආසිරි පෙරපාසල රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් සමන්තාගම ප්‍රජා ශාලාවට වෙත ගෙනයාමට අනුමැතිය ලබා දෙන ලෙසත් එහි වැසිකිලියක් නොමැති නිසා වැසිකිලියක් සකස් කරගැනිම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස එම පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලිකාව විසින් ඉල්ලීමක් සිදු කර ඇත.ආසිරි පෙරපාසල ප්‍රාදේශීය සභාවට අයත් සමන්තාගම ප්‍රජා ශාලාව වෙත ගෙනයාමට මෙන්ම වැසිකිලිය සකස් කරදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී වික්‍රමසිරි මැතිතුමා**

මෙම සමන්තාගම ප්‍රජා ශාලාව සභාවට අයත්ද?

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

සමන්තාගම ප්‍රජා ශාලාව සභාවට අයිති බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා**

ආසිරි පෙරපාසල සමන්තාගම ප්‍රජා ශාලාව සභාවට රැගෙන යාමට එහි තිබෙන සමිති සමාගම්වලින් විරුද්ධත්වයක් නැතිද යන්න ගරු මන්ත්‍රීතුමන් විසින් විමසන ලදි.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

මරණාධාර සමිතිය විසින් කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර මේ පිළිබඳව සොයාබලා ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**තීරණය -**

ඒ පිළිබඳව පරීක්ෂා කර ආසිරි පෙරපාසල සභාවට අයත් සමන්තාගම ප්‍රජා ශාලාව වෙත ගෙනයාමට තීරණය විය.

## ඉ).II.16

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පළාත් පාලනය පිළිබඳව ශ්‍රී ලංකා ආයතනය විසින් 2023 ජනවාරි මාසයේදි පැවැත්වීමට නියමිත පළාත් පාලනය පිළිබඳව තෙදින පුහුණු වැඩමුළුව සඳහා සහභාගීවීමට ලේකම්තුමිය හා එල්.කේ.එස්.ගුණතිලක මිය (කළමනාකාර සේවා නිලධාරි) කැමැත්ත දක්වන බැවින් එම ආයතනය මඟින් එම පුහුණුවට එක් පුහුණුලාභියෙකුගෙන් රු.6000.00 මුදලක් අය කරන බවත් එම පුහුණුවට සහභාගීවීම සඳහා අවශ්‍ය මුදල් ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පුහුණුව සඳහා අවශ්‍ය වන රු.12,000.00ක මුදල ලබාදීමට තීරණය විය.

## ඉ).II.17

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

වහව හන්දියේ මාළු විකිණීම සඳහා අවසර ලබාගැනීම සඳහා කොටවැල්ල, කාඩවට්ටිය, කටුලන්දවත්ත පදිංචි කේ.කේ.ස්වර්ණමාලි මහත්මිය සහ රඹුක්කන, වහව, බංගලාවත්ත පදිංචි කේ.කේ.නිල්මිණි කුමාරි මහත්මිය යන අය විසින් ඉල්ලීමක් සිදු කර ඇත. දෙපිරිසම කැඳවා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සුමිත් රත්නකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උදය ප්‍රසාද් තිලකරත්න මැතිතුමා**

නිල්මිණී මහත්මිය වාහනයක මාළු වෙළදාම සිදු කරන බවත් ස්වර්ණමාලි මහත්මිය ගොඩනැඟිල්ල තුළ වෙළදාම් සිදු කරන බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

වහව මාළු ලැල්ල සම්බන්ධව මීත් පෙර ටෙන්ඩර් කරනු ලැබුවත් කිසිවෙකු මිලදී නොගත් අතර මෙහි නීතිමය ගැටළුවක් පවතින බවත් ටෙන්ඩර් කටයුත්තක් සිදු කිරීමට නම් සභා දේපලක් තිබිය යුතු අතර ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.දෙපිරිසම කැඳවා කරුණු පැහැදිලි කරදීම සුදුසු බවත් කඩ කාමරය තුළ වෙළදාම සිදුකරන තැනැත්තාට බලපත්‍රය ගෙන විකුණන ලෙස පැවසීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි. එසේම මේ සම්බන්ධව දෙදෙනාම කැඳවා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දෙපිරිසම කැඳවා සාකච්ඡා කිරීමට තීරණය විය.

## ඉ).II.18

රඹුක්කන පරපේ මීදෙණියවත්ත පී.ජී.නිශාන්ත ජයවීර මහතා විසින් මීදෙණියවත්ත සුසාන භූමිය තුළ වැට මායිමේ ඇති කොස් ගස තම නිවසට අනතුරුදායක බව පවසමින් එය ඉවත් කරදෙන ලෙසට ඉල්ලීමක් සිදු කර ඇත.එම කොස් ගස කපා ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. තිලකරත්න බංඩා මැතිතුමා විසින් ස්ථිර කර ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

**කොස් ගස කැපීම සඳහා මිල ගණන් කැඳවා වෙන්දේසි කර ඉවත් කිරීමට තීරණය විය.**

## ඉ).II.19

සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණවල එදිනෙදා සිදුවන හදිසි අලුත්වැඩියා,සේවා කටයුතු,අමතර කොටස් මිලදීගැනීම,උපකරණ හා ද්‍රව්‍ය සපයාගැනීම ආදිය සඳහා රු.15,000.00ක අත්තිකාරම් මුදලක් ලබාගැනීමටත් එය මුළු වර්ෂය පුරාම ප්‍රතිපූර්ණය කර ගනිමින් ප්‍රයෝජන ගැනීමට මෙන්ම අවුරුද්ද අවසානයේ පියවීම සිදු කරනු ලබයි. එම මුදල ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල ගෙවීම් සහිත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ඉහත ගෙවීම් අනුමත කිරීමට තීරණය විය.

## ඉ).II.20

### ගෙවීම් අනුමැතිය

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පහත ගෙවීම් කිරීමට ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ඩී.එම් බණ්ඩාර කුලසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

i. තරිඳු මෝටර්ස්,වල්ගම පාර,මීදූම,යටගම - රු.99,500.00
(ප්‍රාදේශීය සභාවට අයත් ගල්රෝල අලුත්වැඩියා කිරීම වෙනුවෙන්)

ii. තරිඳු මෝටර්ස්,වල්ගම පාර,මීදූම,යටගම - රු.26,600.00
(සභාවට අයත් WP.RW – 9023 අංක දරන විමල් ට්‍රැක්ටර් ට්‍රේලරයේ පිටුපස රෝද දෙකේ සහ ජැක් එකේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන්)

iii. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.8241.56
(සභාව සතු SG.YU - 6935 අංක දරණ බජාජ් ත්‍රිරෝද රථයේ රක්ෂණාවරණය 2023.01.09 දිනෙන් අවසන් වන අතර ඉදිරි වර්ෂයක් සඳහා රක්ෂණාවරණය සිදුකිරීම වෙනුවෙන්)

iv. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම,නො 21,වොක්ෂෝල් වීදිය,කොළඹ 02 - රු.10,514.69
(සභාව සතු SG.52 - 6699 අංක දරණ L – 200 ඉසුසු කැබ් රථයේ 2022.12.26 දිනෙන් ඉදිරියට (2022/2023) වර්ෂයක් සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන්)

v. එස්.එම්.කේ.බී.සමරකෝන්,සමරකෝන් ට්‍රේඩර්ස්,තෝමස් සිල්වා මාවත,රඹුක්කන - රු.12,845.00
(ප්‍රජා ශාලාවේ වේදිකාවේ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන්)

vi. Kegalle distributors(pvt)Ltd, No 80, Molamure Mawatha, Kegalle - රු.110,664.00
(2023.01.02 දින ආදාහනාගාරය වෙත 37.5Kg ලිට්රෝ ගෑස් සිලින්ඩර් 06ක් සැපයීම වෙනුවෙන්)

vii. තරිඳු මෝටර්ස්,වල්ගම පාර,මීදූම, යටගම - රු.44,500.00
(සභාවට සතු SG.RE – 2261 අංක දරණ 350 DI ස්ටැන්ඩඩ් කපල ප්‍රවාහන ට්‍රැක්ටරයේ පිටුපස හිච් පද්ධතිය,රියදුරු ආසනය එන්ජිමේ ඔයිල් කාන්දුව ආදි කටයුතු සඳහා අලුතින් අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීම වෙනුවෙන්)

අදාල ගෙවීම් සහිත යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

**තීරණය -**

ඉහත ගෙවීම් අනුමත කිරීමට තීරණය විය.

## ඉ).II.21 ඇස්තමේන්තු අනුමැතිය

❖ ගරු සභාපති අතුල හඳගම මැතිතුමා

පහත ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති අතුල හඳගම මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

1. නිකගොල්ලවත්ත මාර්ගය අතුරු මාර්ගය අවහිරව ඇති කළුගල කඩා ඉවත් කිරීම - රු.32,000.00
2. රඹුක්කන ජාතික ඉතිරි කිරීමේ බැංකු ගොඩනැගිල්ලේ ග්‍රිල් සවි කිරීම - රු.274,532.50
3. ගොඩගන්දෙණිය මුවපිටිය මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
4. හිරිවඩුන්න හපුලන්ද මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
5. කමතවත්ත මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
6. හේවාදිවෙල මහ විද්‍යාල මාර්ගය සංවර්ධනය කිරීම - රු.200,000.00
7. කපුරුකඩේ මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
8. කිරිවානා මාර්ගය සංවර්ධනය කිරීම - රු.100,000.00
9. මුද්දනාව අංක 01 මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු.100,000.00
10. හේනේපොල මාර්ගයේ සිට ඊරියගහදෙණිය මාර්ගය සංවර්ධනය කිරීම - රු.100,000.00
11. පින්නවල කනත්ත අසලින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ද්‍රව්‍ය ලබාදීම- රු.200,000.00
12. පින්නවල හඳගමවත්ත මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
13. රණවන ඉඹුල්ගස්දෙණිය රොසයිඩ් ජනපද මාර්ගය සංවර්ධනය කිරීම - රු.85,000.00
14. වරාගොඩ සුසාන භූමිය සුද්ද කිරීම - රු.153.000.00
15. පල්පාත සුසාන භූමිය සුද්ද කිරීම - රු.193.800.00
16. අශෝක කරුණාරත්න ක්‍රීඩාංගනයේ ඉතිරි වැඩ - රු.150,000.00
17. සමන්තාගම ප්‍රජාශාලා භූමියේ වැසිකිලියක් ඉදිකිරීම - රු.600,000.00
18. ළමා උද්‍යානය ස්ථාපිත කිරීම සඳහා පිටිය සැකසීම සහ ආරක්ෂිත වැට ඉදිකිරීම-රු.1,800,000.00
19. සතිපොල භූමියේ ඉහළ කොටසේ ආයුර්වේද ගොඩනැගිල්ල ඉදිකිරීම -රු.4,200,000.00
20. රඹුක්කන සතිපොල භූමිය ආරක්ෂිත වැට ඉදිකිරීම - රු.3,000,000.00
21. කාර මිලදීගැනීම සඳහා - රු.1,000,000.00
22. කොම්පෝස්ට් පොහොර අලෙවි සැල ඉදිකිරීම සඳහා (1 අදියර) - රු.3,000,000.00
23. වාහන අංගනයේ වැඩ අවසන් කිරීම සඳහා - රු.1,500,000.00
24. කොටගම ගල්ඇණමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම - රු.78,000.00
25. රඹුක්කන නගරයේ පෞද්ගලික බස් නැවතුම්පොල වැසිකිලිය අලුත්වැඩියා කිරීම- රු.231,012.20
26. මුවපිටිය ගොඩගන්දෙණිය මාර්ගයේ මුවපිටිය කොටස ප්‍රතිසංස්කරණය කිරීම - රු.200,000.00
27. කොටකඩර පිවිසුම් මාර්ගයේ මතු බිල අලුත්වැඩියා කිරීම - රු.30,000.00
28. කොටගම පොදු සුසාන භූමියේ JCB යන්ත්‍රය යොදා සකස් කිරීම - රු.28,000.00
29. කොටගම බොරැල්ලවත්ත ළිඳ අලුත්වැඩියා කිරීම - රු.100,000.00
30. මුවපිටිය සුසාන භූමිය අසලින් යන පින්නවල මාලාකාරී මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - රු.50,000.00

31. කොටවැල්ල අඹගහමුල ලන්ද මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
32. උඩහිඟුරුවක සුසාන භූමියේ පිවිසුම් මාර්ගයට බෝක්කු බට සැපයීම - රු.72,000.00
33. කාඩවට්ටිය වත්ත මාර්ගය සහ ක්‍රීඩා පිටිය මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය භාවිතයෙන් සකස් කිරීම - රු.90,000.00
34. කාඩවට්ටිය පොදු සුසාන භූමිය JCB යන්ත්‍රය යොදා සකස් කිරීම - රු.16,000.00
35. ආදොළුව ගල්කරුවත්ත මාර්ගය සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යෙදවීම - රු.60,000.00
36. තල්දැව හඟවෙල ප්‍රධාන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - රු.300,000.00
37. දැලිවල තිස්ස විද්‍යාල මාර්ගය මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සකස් කිරීම - රු.60,000.00
38. නරංබැද්ද රැක්කහේන මාර්ගයේ ජලනල එලීම සඳහා කාණු කැපීම - රු.23,400.00
39. හීනාබෝව ඉහලවෙල මාර්ගය ස්කේයාවේටර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම - රු.75,000.00
40. කංසලගමුව පුවක්ගහමුල මාර්ගය වෙත වැටී ඇති පස්කන්ද ඉවත් කිරීම - රු.43,700.00
41. කාර්යාල ගොඩනැගිල්ලේ ඉහල මහලේ ජනෙල් සඳහා GI බට ආවරණ යෙදීම - රු.474,300.00
42. පොහොරඹෙ තේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම - රු.57,600.00
43. ඉඹුල්ගස්දෙණිය මොරගොල්ල මංසන්දිය සඳහා හියුම් පයිප්ප යෙදීම - රු.23,052.00
44. වහව බංගලාවත්ත ආදොළුව මාර්ගය සඳහා බෝක්කු බට ලබාදීම - රු.27,664.00

අදාල ඇස්තමේන්තු සහිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

ඉහත ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.

## ඉ). II.22 මිල ගණන් කැඳවීම.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**

i. ආර්ථික අපහසුතා සහිත දරුවන්ට පාසල් පොත් ලබාදීමේ වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ ආකෘතිපත්‍ර මුද්‍රණය කිරීම සඳහා සිදුකළ මිල ගණන් කැඳවීමට අදාළව පහත මිල ගණන් ලැබී තිබුණි.

| අනු අංකය | සිදු කළ යුතු මුද්‍රණ කාර්යය | සිදුකර දෙනු ලබන ඒකක මිල ගණන | | |
|---|---|---|---|---|
| | | සුරේඛා මුද්‍රණාලය - දුම්රිය පොළ පාර, රඹුක්කන | සිතාරා ප්‍රින්ටර්ස්, කුරුණෑගල පාර රඹුක්කන | ශීලා ප්‍රින්ටර්ස්, කෙලින් වීදිය රඹුක්කන |
| 1 | දරුවන්ට පාසල් පොත් ලබාදීමේ වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ ආකෘතිපත්‍ර මුද්‍රණය කිරීම | රු.17,500.00 | රු.12,125.00 | රු.13,200.00 |

ඒ අනුව අවම මිල ගණන් යටතේ මුද්‍රණය කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී ධර්මසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ මුද්‍රණ කටයුතු සිදු කිරීමට තීරණය විය.

ii. සභාව සතු SG.52-6699 අංක දරණ ඉසුසු කැබ් රථය කාර්යාල ගමන් බිමන් රාජකාරී කටයුතු සඳහා පවතින එකම වාහනය වන බවත් මෙම වාහනයේ අලුත්වැඩියා කටයුතු බොහෝ කාලයකින් සිදුකර නොමැති බවත් ඇන්ජිම තුල කාර්මික දෝෂ බහුලව ඇති අතර මෙම වාහනය පූර්ණ අලුත්වැඩියාවක් සිදුකිරිම සඳහා අප සභාවේ ලියාපදිංචි ගරාජය වන තරිඳු මෝටර්ස් ආයතනය විසින් අලුත්වැඩියා කටයුතු සිදුකිරිම සඳහා ඉදිරිපත් කළ දළ ඇස්තමේන්තුව සහිත මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | තරිඳුමෝටර්ස්, සමන්, මීදුම, යටගම,රඹුක්කන | රු.606,500/= |

ඒ අනුව ලැබී ඇති මිල ගණන යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තිරණය -**

අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සඳහා තරිඳු මෝටර්ස් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 606,500/= ක මිල ගණන අනුමත කිරිමට තිරණය විය.

iii. සභාව සතු SG.RW-5799 අංක දරණ විමල් ට්‍රැක්ටර් ට්‍රේලරයේ පිටුපස රෝද දෙකේ රේසර් ගැසීම,සිලු ගැසීම,හබ් ලියවා සවි කිරිම,ජැක් එකේ සීල් සෙට් එක දැමීම ආදී අලුත්වැඩියා කටයුතු සඳහා කැඳවන ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | අරවින්ද මෝටර්ස්, ඉහල වල්පොල, කොටවැල්ල, රඹුක්කන | රු.29,000/= |
| 02 | තරිඳු මෝටර්ස්, මීදුම, යටගම, රඹුක්කන | රු. 28,750/= |
| 03 | සේන මෝටර්ස්, නො 02, කරුණාරත්නගම, රඹුක්කන | රු. 30,000/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තිරණය -**

අවම මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සහ උපකරණ යොදා අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිමට තිරණය විය.

vi. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ විවිධ ප්‍රචාරන කටයුතු හා මහජන දැනුවත් කිරීම් සඳහා අවශ්‍යතාවය මත වරින් වර කුලී පදනම මත ශබ්ද විකාශන යන්ත්‍ර සපයාගැනිමට සිදු කරන ලද ප්‍රාදේශීය මිල ගණන් කැඳවීමට ආදාළව පහත මිල ගණන් ලැබී තිබුණි.

| අනු අංකය | නම | අය කරන මුදල |
|---|---|---|
| 01 | ඩබ්.වමිලා පුෂ්ප කුමාරි ජයවර්ධන, වතුරේගෙදර, ගල්පොල, මොලගොඩ | රු.1800/= |
| 02 | තුෂාර සවුන්ඩ් - ආර්.එම්.එම්.ටී.රත්නායක, වල්උලේ නිවස, බතඹුරේ, රඹුක්කන | රු.1900/= |
| 03 | කේ.උපාලි ජයසිංහ, උපාලි සවුන්ඩ්, රංදෙණිය, හිරිවඩුන්න | රු. 2000/= |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ අවශ්‍යතාවය මත ශබ්ද විකාශන යන්ත්‍ර සපයාගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබු අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ආර්.අනුලාවති මැණිකේ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ අවශ්‍යතාවය මත තීරණය විය.

vii. රඹුක්කන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරිම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදිගැනිමට සිදුකරන ලද ප්‍රාදේශීය මිල ගණන් කැඳවීමට අදාළව පහත මිල ගණන් ලැබී තිබුණි.

| අනු අංකය | අයිතමය | සපයනු ලබන ඒකක මිල ගණන | | |
|---|---|---|---|---|
| | | සුරම්‍යා සෙරමික් - කුරුණෑගල පාර රඹුක්කන | යුතාරා එන්ටර්ප්‍රයිසස්, කුරුණෑගල පාර රඹුක්කන | සමරකෝන් ට්‍රේඩර්ස්, රඹුක්කන |
| 1 | 13A Plug base | රු.1095.00 | රු.1160.00 | රු.1155.00 |
| 2 | ¾ Trupping Screen | රු.2.50 | රු.3.50 | රු.5.00 |
| 3 | 4 Way sun box | රු.565.00 | රු.600.00 | රු.695.00 |
| 4 | ¾ Casing | රු.655.00 | රු.680.00 | රු.660.00 |

ඒ අනුව ලැබී ඇති අවම මිල ගණන් යටතේ භාණ්ඩ සපයාගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරනු ලැබූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ.එස්.කේ.කේ සුමනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

අවම මිල ගණන් යටතේ භාණ්ඩ සපයාගැනිමට තීරණය විය.

**ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සළකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස,ඒවා සළකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.රසික සුමේධ ආරියරත්න මැතිතුමා**

2022.12.13, 2022.12.27 යන දිනවල පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැලසීමේ කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට පී.ජී.රසික සුමේධ ආරියරත්න මැතිතුමන් විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. සිරිසේන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**

2022.12.13,2022.12.27 යන දිනවල පැවත්වූ මුදල් හා ප්‍රතිපත්ති සැලසීමේ කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බව තීරණය විය.

**උ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය, එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛණ ඉදිරිපත් කිරීම.**

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මංමාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| 10 වරිපනම් බදු | 1,282,661.60 | - | - | - | 77,500.00 | 1,360,161.60 |
| 20 කුලී | - | 32,700.00 | 212,460.00 | 901,399.16 | 87,106.00 | 1,233,665.16 |
| 30 බලපත්‍ර සේවා | 93,288.00 | 90,450.00 | 87,990.00 | - | - | 271,728.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 9,050.00 | 533,023.00 | 25,275.00 | - | 925.00 | 568,273.00 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | 891,841.00 | - | - | 35,395.00 | 4,697.00 | 931,933.00 |
| 60 වෙනත් ආදායම් | *51,044.01* | *29,250.00* | *21,950.00* | - | *450.00* | *102,694.01* |
| 70 වෙනත් ආදායම් | 3,188,375.27 | 1,062,984.67 | 898,375.00 | 42,860.00 | 372,455.00 | 5,565,049.94 |
| පුනරාවර්තන ආදායම් එකතුව | **5,516,259.88** | **1,748,407.67** | **1,246,050.00** | **979,654.16** | **543,133.00** | **10,033,504.71** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | |
| 80 මූලණ ලැබීම් | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව | **5,516,259.88** | **1,748,407.67** | **1,246,050.00** | **979,654.16** | **543,133.00** | **10,033,504.71** |
| සේවක ණය | | | | | | |
| මහජන බැංකුව-සේවක ණය | 40,323.00 | | | | | 40,323.00 |
| ලංකා බැංකුව-සේවක ණය | 364,614.40 | | | | | 364,614.40 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 3,887,433.37 | | | | | 3,887,433.37 |
| සමුච්චිත අරමුදල | 2,240,490.00 | | | | | 2,240,490.00 |
| ශීර්ෂ ආදායම | 2,500.00 | | | | | 2,500.00 |
| අත්තිකාරම් | 88,857.52 | | | | | 88,857.52 |
| ආයෝජන ආපසු ලැබීම් | - | | | | | - |
| වෙනත් ලැබීම් | 81,473.04 | | | | | 81,473.04 |
| මුළු එකතුව | **12,221,951.21** | **1,748,407.67** | **1,246,050.00** | **979,654.16** | **543,133.00** | **16,739,196.04** |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මංමාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| 10 වැටුප් දීමනා | 3,560,605.63 | 1,772,396.26 | 1,037,322.76 | 42,860.00 | 496,199.80 | 6,909,384.45 |
| 20 ගමන් වියදම් | 116,661.00 | 17,743.50 | 41,156.75 | - | 7,600.00 | 183,161.25 |
| 30 සැපයුම් හා උපකරණ | 271,452.50 | 192,417.00 | 725,531.00 | 42,400.00 | 70,300.00 | 1,302,100.50 |
| 40 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 355,325.72 | 131,600.00 | 178,782.90 | 1,050.00 | 18,161.54 | 684,920.16 |
| 50 ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යතා හා වෙනත් සේවා | 312,738.97 | 324,359.92 | 30,000.00 | 138,397.76 | 33,468.15 | 838,964.80 |
| 60 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | - | 18,074.57 | - | - | 18,074.57 |
| 70 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 153,054.56 | 70,723.71 | - | - | 15,000.00 | 238,778.27 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 124,993.71 | - | - | - | - | 124,993.71 |
| පුනරාවර්තන වියදම් එකතුව | **4,894,832.09** | **2,509,240.39** | **2,030,867.98** | **224,707.76** | **640,729.49** | **10,300,377.71** |
| 09 ප්‍රාග්ධන වැය | - | | 7,959,704.70 | | | 7,959,704.70 |
| 10 ණය ආපසු ගෙවීම | - | | 444,360.20 | | | 444,360.20 |
| ප්‍රාග්ධන වැය එකතුව | **-** | **-** | **8,404,064.90** | **-** | **-** | **8,404,064.90** |
| පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව | **4,894,832.09** | **2,509,240.39** | **10,434,932.88** | **224,707.76** | **640,729.49** | **18,704,442.61** |
| සේවක ණය | | | | | | |
| මහජන බැංකුව-සේවක ණය | - | | | | | - |
| ලංකා බැංකුව-සේවක ණය | 223,141.16 | | | | | 223,141.16 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| තැන්පත් | 3,545,497.73 | | | | | 3,545,497.73 |
| විවිධ ණයගිමියෝ | - | | | | | - |
| ගබඩා ණයහිමියෝ | 2,798,223.20 | | | | | 2,798,223.20 |
| අත්තිකාරම් | 90,427.72 | | | | | 90,427.72 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | - | | | | | - |
| වෙනත් ගෙවීම් | - | | | | | - |
| මුළු එකතුව | **11,552,121.90** | **2,509,240.39** | **10,434,932.88** | **224,707.76** | **640,729.49** | **25,361,732.42** |

## ඌ) වෙනත් කාරණා

**1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.ඩී ශ්‍රීලාල් මැතිතුමා**

1. නාමල්ගමුව ප්‍රජා ශාලාව සභාව සතු දේපලක් වන අතර එහි ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලැබුවත් එම කටයුතු ක්‍රියාත්මක නොවූ බවද එම ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදි.

2. ඉඹුල්ගස්දෙණිය පෙරපාසල නැවත ආරම්භ කිරීම සඳහා අයවැය තුලින් සාකච්ඡා කරනු ලැබූ අතර පෙරපාසල නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දීම මෙන්ම පුස්තකාල භූමිය තුළ ඇති ළමා උද්‍යානයට උපකරණ කිහිපයක් අවශ්‍ය වී ඇති බැවින් එම උපකරණ ලබාගැනීම සඳහා කටයුතු සලසා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමන් විසින් පවසන ලදී.

❖ **ගරු සභාපති අතුල හඳගම මැතිතුමා**
පෙරපාසල නැවත ආරම්භ කිරීමට මෙන්ම ළමා උද්‍යානයට උපකරණ කිහිපයක් ලබා දීමේ හැකියාව පවතින බවද ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

<u>අවසානය</u>

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.11.45 ට පමණ අවසන් කරන ලදී.

ඊ.එම්.ඒ.එන්.බී. හඳගම
සභාපති
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

ඊ. මු. අතුල නි. බ. හඳගාම
සභාපති
රඹුක්කන ප්‍රාදේශීය සභාව